## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

# වාර්ෂික වාර්තාව

# 2014

## සභාපතිතුමාගේ පණිවුඩය

පාරිභෝගික අධිකාරියේ 2014 වර්ෂයට අදාල මූල්‍යමය සහ මූල්‍යමය නොවන කාර්ය සාධනය අනාවරණය කරන වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව මා සතුටු වෙමි.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවා වසර 11ක් ගතවන අතර මෙම වසර වන විට එහි ප්‍රධාන අරමුණ වන තරඟකාරී වෙළඳ සමාජයක් තුළ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමටත්, දැනුවත් වෙළඳ සමාජ පරිසරයක් බිහිකිරීමත් යන කාර්යයන් සැලකිය යුතු ප්‍රමාණයකින් ළඟාකරගෙන ඇතිබව අපගේ ක්‍රියාකාරිත්ව ප්‍රගතිය තුලින් පිළිඹිබු වන බව මාගේ විශ්වාසයයි. විශේෂයෙන් එසේ අපවෙත ලැබෙන පාරිභෝගික පැමිණිලි මෙන්ම ජනමාධ්‍යය ඔස්සේ කෙරෙන විවේචනයන්ද එම විශ්වාසය තවදුරටත් තහවුරු කර ඇත.

වර්තමාන තරඟකාරී විවෘත ආර්ථික වෙළඳාම තුල අසාධාරණ ලෙස මිළ වැඩිකිරීම, කොන්දේසි සහිත වෙළඳාම, අලෙවිය සීමාකිරීම, අසාධාරණ වෙළඳ කොන්දේසි යන අනිසි වෙළඳ ප්‍රතිපත්ති තුලින් පාරිභෝගික සුබසිද්ධියට පටහැනි දේ සිදුවීම සාමාන්‍ය දෙයකි. මෙවැනි තත්ත්වයක් තුල පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම උදෙසා අපගේ විෂය වපසරියට ගැලපෙන පරිදි දැනට නිකුත් කර ඇති විධානයන්ට අමතරව නව විශේෂ විධානයන් නිකුත් කරමින් මෙම තත්ත්වයන් සමනය කිරීමට උපරිම උත්සාහයක් පවත්නා ව්‍යාපාරික පරිසරය තුල ගෙන ඇත. ඒ අනුව නව නියෝග 04ක් හඳුන්වා දෙන ලද අතර එමගින් සැලකිය යුතු වෙළඳ විෂමාචාර වැළැක්වීමට අධිකාරියට මැදිහත්වීමට අවස්ථාව උදාවුනි. එමෙන්ම රටතුල පවත්වන වැදගත් නියාමන ආයතන වන සෞඛ්‍ය අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා රේගුව වැනි ආයතන සමඟ ඒකාබද්ධව සම්මතයන්ට අනුකූල නොවන ආනයනික වෙළඳ භාණ්ඩ 72ක් අධීක්ෂණයට දායකවෙමින් ඒවා රටතුලට ගෙන්වීම වැලැක්වීම මගින් පාරිභෝගික ආරක්ෂණයට දායක වීමට හැකියාව ලැබිණ. එමෙන්ම වෙළඳපළ දැනුවත් කිරීම් වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම මගින් පාරිභෝගිකයා හා වෙළෙන්දන් දැනුවත් කරමින් වෙළඳපල තුල දැනුවත් පාරිභෝගිකයන් හා වෙළෙන්දන් බිහිකිරීමේ උත්සාහයකද නිරතවිය.

පාරිභෝගික අධිකාරියේ කාර්ය භාරය පිළිබඳ දැනුවත් වූ පාරිභෝගිකයන්ගෙන් අධිකාරිය වෙත ලැබුනු පාරිභෝගික පැමිණිලි සඳහා සාර්ථක විසඳුම් ලබාදීමට සමත්වූ අතර තෘප්තිමත් වූ මෙම පාරිභෝගිකයන් අධිකාරිය වෙත ලිපි හා දුරකථන මගින් ඔවුන්ගේ ප්‍රශංසාව අධිකාරිය වෙත ලබාදී ඇත.

නිශ්චිත හා අත්‍යාවශ්‍ය භාණ්ඩ ලෙස අධිකාරිය විසින් හඳුනාගෙන ඇති භාණ්ඩ වර්ග 15ක දෛනික වෙළඳපල මිල ගණන් පිළිබඳ විමසිල්ලෙන් සහ අධ්‍යයනයෙන් පසු මිල අඩුකිරීමකට හෝ මිල වැඩිවීමක් නම් එය නිසි අධ්‍යයනයකින් හා වියදම් විශ්ලේෂනයකින් අනතුරුව අවම මිල වැඩිවීමකට පමණක් සීමාකිරීමටද උත්සාහ දරා ඇත.

මෙසේ  වෙළඳපළ විධිමත් කිරීමේ කාර්යයන් සිදුකරන අතර වෙළඳපල නීතිරීතීන් අනුගමනය නොකරන වෙළෙන්දන් නීතියේ රැහැනට හසුකරගැනීමට වෙළඳපල වැටලීම් සිදුකළ අතර ඒ අනුව සාර්ථක වෙළඳපළ වැටලීම් 22,402ක් සිදුකරන ලදී.  එමගින් රුපියල් මිලියන 72 ක රාජ්‍ය ආදායමක්ද ඉපයීමට හැකිවිය.

මෙම ජයග්‍රහන ලබා ගැනීමට සහාය දුන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට හා කාර්යය මණ්ඩලයට මාගේ කෘතඥ පූර්වක ස්තූතිය පලකරමි.

එමෙන්ම අපගේ තීන්දු  තීරණ නිවැරදි මාවතට යොමුකරමින් ඒවා අනුමත කිරීමෙන්ද, නොයෙක් අයුරින් උපදෙස්  ලබාදී රාජකාරීන් ඉටු කිරීමට අප ධෛර්යයට පත්කළ  අමාත්‍යාංශ ලේකම්තුමාට සහ ගරු ඇමතිතුමාටද මාගේ හෘදයාංගම ස්තූතිය පල කරමි.

අවසන් වශයෙන් අපගේ ක්‍රියාවලීන්ගෙන් තෘප්තිමත් වී ප්‍රශංසාත්මක ලිපි හා ඇගයීම් ලිපි එවූ සියළුම පැමිණිලිකරුවන්ට/පාරිභෝගිකයින්ටද මාගේ ස්තූතිය මෙයින් පුද කරමි.



හසිත තිලකරත්න
**සභාපති**

## දැක්ම

සදාචාරාත්මක ව්‍යාපාරික පරිසරයක් තුළ මනාව සුරක්ෂිත වූ පාරිභෝගිකයෙකු බිහි කිරීම.

## මෙහෙවර

පාරිභෝගික සවිබල ගැන්වීම, වෙළෙඳාම විධිමත් කිරීම සහ යහපත් තරඟකාරිත්ව ප්‍රවර්ධනය කිරීම තුළින් පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම.

# ඒකාබද්ධ ඉලක්කයන්

- පාරිභෝගිකයා වඩාත් තෘප්තියට පත්වන අයුරින් වෙළඳපොල නියාමනය කිරීම.
- අසාධාරන වෙළෙඳ චර්යාවන්ගෙන් පීඩාවට පත් පාරිභෝගිකයන්ට සහන සැලසීම.
- පාරිභෝගික අධ්‍යාපනය සහ දැනුවත් කිරීම හරහා පාරිභෝගිකයා සවි බල ගැන්වීම.
- තරඟ විරෝධී වෙළඳ චර්යාවන්ගෙන් නිෂ්පාදකයා හා වෙළෙඳුන් ආරක්ෂා කිරීම සහ වඩාත් හිතකර තරඟකාරී වාතාවරණයක් ප්‍රවර්ධනය කිරීම.
- හැකියාවන් වැඩි දියුණු කිරීම තුළින් ආයතනික සංවර්ධනය ළඟා කර ගැනීම.

## ආයතනික සාරධර්ම

**විශ්වාසදායි බව**

කාර්යසාධන අනුකූලතාව පවත්වා ගැනීම සහ විශ්වාසනීයත්වය තහවුරු කිරීම.

**අවංකත්වය සහ ඒකීයත්වය**

සියළුම කාර්යයන්හිදී අවංකවීම, සාධාරණ වීම සහ යුක්ති ගරුක වීම.

**වගකිවයුතු බව**

විනිවිද භාවය ආරක්ෂා කිරීම, වග කිවයුතු බව සහ ඉටු කරනු ලබන සියළුම කාර්යයන් සම්බන්ධයෙන් වගකීම දැරීම.

**කණ්ඩායම් හැඟීම**

අන්‍යෝන්‍ය අවබෝධය, එකිනෙකට ගෞරව කිරීම සහ එකිනෙකා අතර විශ්වාසය ගොඩ නැංවීම සහ මනා සන්නිවේදනය සහ නම්‍යශීලිබව වර්ධනය කරමින් පොදු ඉලක්කයන් ළඟාකර ගැනීම උදෙසා සියළුම සේවකයන් එක්ව කටයුතු කිරීම.

**පිළිගැනීම**

සේවකයින්ගේ විශිෂ්ඨ කාර්යඵල අගය කිරීම හා ප්‍රශංසා කිරීම.

**කැපවීම**

පවරා ඇති කාර්යයන් කැපවීමෙන් යුක්තව ඉටු කිරීම.

**ප්‍රතිචාර දැක්වීම**

සේවා සැලසීම සඳහා කැමැත්තක් දැක්වීම සහ සූදානම්වීම

**නිර්මාණශීලී බව සහ නවෳතාවයන් දිරි ගැන්වීම.**

සියළුම ක්ෂේත්‍රයන් අඛණ්ඩව වැඩි දියුණු කිරීම සඳහා නව අදහස් උත්පාදනය කිරීම.

1 වන සහ 2 වන මහළ
සතොස මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල
අංක 27, වෙක්ෂෝල් වීදිය
කොළඹ 02
2016.05.12

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,

ගරු ඇමතිතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) වගන්තිය ප්‍රකාර 2014 වසර සඳහා වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද ශේෂපත්‍රය, ආදායම් සහ වියදම් ගිණුම් සහ විගණකාධිපතිවරයාගේ වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

මෙයට,

විශ්වාසී,



හසිත තිලකරත්න
**සභාපති**
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

# වාර්ෂික වාර්තාව - 2014

| පටුන | | | පිටුව |
|---|---|---|---|
| 1. | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිළිබඳ හැඳින්වීම | | |
| | 1.1 | හැඳින්වීම | 08 |
| | 1.2 | අධිකාරියේ ව්‍යවස්ථාව | 08 |
| | 1.3 | අධිකාරියේ කාර්ය මණ්ඩලය | 09 |
| | 1.4 | පාරිභෝගික කටයුතු සභාව | 10 |
| 2. | අධිකාරියේ අභිමතාර්ථ | | 11 |
| 3. | අධිකාරියේ කාර්යභාරය | | 12 |
| 4. | 2014 වසර සඳහා පාරිභෝගික කටයුතු අධිකාරියේ/පාරිභෝගික කටයුතු සභාවේ කාර්යසාධනය | | 13-31 |
| 5. | 2014 දෙසැම්බර් 31 වන දින වන විට පැවති මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | | 32 |
| 6. | 2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳව සවිස්තරාත්මක වාර්තාව | | 33 |
| 7. | 2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශය | | 34-40 |
| 8. | 2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව | | 41-47 |
| 9. | විගණකාධිපතිවරයාගේ වාර්තාව සම්බන්ධයෙන් සභාපතිතුමාගේ අදහස් | | 48-52 |

# 1. අධිකාරිය පිළිබඳ හැඳින්වීම

## 1.1 හැඳින්වීම

1979 අංක 1 දරණ පාරිභෝගික ආරක්ෂණ පනත සහ 1987 අංක 1 දරණ සාධාරණ මිල කොමිසම පනත ද, 1950 මිල පාලන පනත ද අහෝසි කරමින් සම්මත කර ගන්නා ලද 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු අධිකාරිය පනත මගින් පාරිභෝගික කටයුතු අධිකාරිය ඇති කර තිබේ.

මෙම පනතේ පූර්විකාවේ සඳහන් කර ඇති පරිදි පාරිභෝගික කටයුතු අධිකාරියේ මූලික අභිමතාර්ථය වන්නේ වෙළඳාම සහ භාණ්ඩ හා සේවාවන්හි මිල නියාමනය කිරීම තුළින් පාරිභෝගිකයින්ට වඩාත් හොඳ ආරක්ෂාවක් සලසා දීම සහ අසාධාරණ වෙළඳ පරිචයන්ගෙන් සහ සීමා ඇති කරවන වෙළඳ පරිචයන්ගෙන් වෙළඳුන් සහ නිෂ්පාදකයන් ආරක්ෂා කර ගැනීමයි. තවද, හැකි සෑම අවස්ථාවකදීම තරඟකාරී මිල ප්‍රවර්ධනය කිරීම මෙන් ම, භාණ්ඩ හා සේවා අලෙවිකරුවන් සහ නිෂ්පාදකයින් අතර යහපත් තරඟකාරීත්වයක් ඇති බව සහතික කරගැනීමට සිදු කරනු ඇතැයි මෙහිදී අපේක්ෂා කෙරේ.

## 1.2 අධිකාරියේ ව්‍යවස්ථාව

පනතේ සලසා ඇති විධිවිධාන ප්‍රකාරව අධිකාරිය සභාපතිවරයෙකුගෙන් සහ පනතේ නියම කර ඇති සුදුසුකම් සහ අත්දැකීම් සහිත පුද්ගලයින් අතරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයින් 10 කට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත වේ.

### 2014 වසරේදී අධිකාරියේ සාමාජිකයින්

2014 වසර අවසාන වන විට අධිකාරියේ සාමාජිකයින් වශයෙන් සිටි පුද්ගලයින්ගේ නම් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 1. | රූමි මර්ෂුක් මහතා | සභාපති |
| 2. | මිල්ටන් අමරසිංහ මහතා | පූර්ණ කාලීන සාමාජික |
| 3. | මේජර් ජනරාල් නිමල් ඒ ජයසූරිය | පූර්ණ කාලීන සාමාජික |
| 4. | සුනිල් ජයවීර මහතා | පූර්ණ කාලීන සාමාජික |
| 5. | ජයන්තිපුර විමලවංශ හිමි | සාමාජික |
| 6. | එම්.එච්.එෆ්. ෂෙරීෆ් මහතා | සාමාජික |
| 7. | මේජර් ජෙනරාල් ජී. චන්ද්‍රවංශ | සාමාජික |
| 8. | පින්සිත් අමිල පෙරේරා මහතා | සාමාජික |
| 9. | එම්.එන්.පී. ගුණරත්න මෙය | අමාත්‍යාංශ නියෝජිත |
| 10. | කේ.ඩී.ඩී.කේ ද ආබෲ මහතා | සාමාජික |
| 11. | ඒ.එම්.විජයරත්න අධිකාරී මහතා | සාමාජික |
| 12. | එම්.ඒ.විමලවීර මහතා | සාමාජික |
| 13. | ඩී.සී. ක්‍රිස්ටි ජයසේකර මහතා | සාමාජික |
| 14. | වරුණ අලව්ව මහතා | සාමාජික |
| 15. | ඩබ්ලිව්.ඒ.සී. හේමකුමාර මහතා | සාමාජික |
| 16. | ජේ.එම්.ජයතිලක ජයසුන්දර මහතා | සාමාජික |
| 17. | ආර්.බී. තෙන්නකෝන් මහතා | සාමාජික |

18. ඩබ්ලිව්. සුධම්මික වීරමන් මහතා සාමාජික
19. සමන් සංජීව පතිරණ මහතා සාමාජික
20. ටී.ජී.ජී. ධර්මවර්ධන මහතා සාමාජික
21. ආචාර්ය ටී.බී. ආනන්ද ජයලාල් මහතා සාමාජික
22. කේ.ඒ.ඩී.ආර්. ක්‍රිස්ටි මහතා සාමාජික
23. ජී.කේ.ජී.එල්.එස්.බී ජයවර්ධන මහතා සාමාජික
24. දුෂාන් සෝසා මහතා සාමාජික
25. මාධව සංජීව වත්තේගම මහතා සාමාජික
26. වෛද්‍ය ලක්ෂ්මි සෝමතුංග මහතා සාමාජික
27. එන්.එච්.ඒ. කරුණාවතී මිය සාමාජික
28. එම්.බී.බී. අත්තනායක මහතා සාමාජික
29. ඩී.එස්.පී. සේනාරත්න මහතා භාණ්ඩාගාර නියෝජිත
30. ජේ.එම්. මංගලතිස්ස මහතා සාමාජික
31. ඉසුරු මලින්ද ද සිල්වා මහතා සාමාජික
32. වෛද්‍ය ජයන්ත බලවර්ධන මහතා සාමාජික
33. සුජීව ලොකුහේවා මහතා සාමාජික

## 1.3 අධිකාරියේ කාර්ය මණ්ඩලය

රූමි මර්ෂුක් මහතා 2014 වසරේදී ද අඛණ්ඩව සභාපති වශයෙන් කටයුතු කළේය. 2014 දෙසැම්බර් 3 වන දින සිට බලපැවැත්වෙන පරිදි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට ජේ.එම්.ඒ. ඩග්ලස් මහතා (ශ්‍රී ලංකා පරිපාලන සේවය - 1 පන්තිය) පත් කරන ලදී.

2014 වසරේදී අධිකාරියෙහි අංශ ප්‍රධානීන්

| | නම | තනතුර |
|---|---|---|
| 01 | දීප්ති තිසේරා මහත්මිය<br>M.PA.(PIM-Sri J) නීතිඥ | අධ්‍යක්ෂිකා<br>අනුකූලවීම් සහ බලගැන්වීම් |
| 02 | චන්ද්‍රිකා තිලකරත්න මහත්මිය<br>B.Sc Agri (Sp) M.Sc(Mgmt) | අධ්‍යක්ෂිකා<br>පාරිභෝගික කටයුතු සහ තොරතුරු |
| 03 | ශාන්තිනී තිරුනීලකන්දන් මහත්මිය<br>(ACEA) | අධ්‍යක්ෂිකා<br>තරඟකාරිත්ව ප්‍රවර්ධන |
| 04 | ඩබ්.එම්. ප්‍රියන්ත මහතා<br>MPM, B.Com (Sp) Hons, AIPFM, DPFM | අධ්‍යක්ෂ<br>මුදල් |
| 05 | සම්පත් අගුලුගහ මහතා<br>B.Com (Sp) Hons, AIPM(SL). Dip in PM | අධ්‍යක්ෂ<br>මානව සම්පත් හා පරිපාලන |
| 06 | රොහාන් මීවනගේ මහතා මෙම කාලය තුළදී අඛණ්ඩව අධ්‍යක්ෂ - මිලකිරීම් සහ කළමනාකරණ තනතුරේ රාජකාරී කළේය. | |
| 07. | රසිකා සාවිත්‍රි විජේසේකර මිය<br>B.Sc (Accounting (SP) Hons USJ, CBA,MAAT | අභ්‍යන්තර විගණක |

## 1.4 පාරිභෝගික කටයුතු සභාව

මෙම සභාව විශේෂඥයින් තිදෙනෙකුගෙන් සමන්විත වන අයුරින් පිහිටුවා තිබෙන අතර ඔවුන් වාණිජ නීතිය, ව්‍යවසාය කළමණාකරණය, වෙළඳ පරිචයන් හා පාරිභෝගික කටයුතු යනාදී ක්ෂේත්‍රවල පුළුල් පළපුරුද්දක් ලබා ඇති අය වෙති. පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් යොමු කරනු ලබන සියලු ඉල්ලීම් කෙරෙහි මෙම සභාව අවධානය යොමු කර තීරණය කරනු ඇත. මෙයට අමතරව, වගන්ති අංක 38 යටතේ වූ තරගකාරිත්ව විරෝධී හැසිරීම්වලට අදාළ පැමිණිලි විභාග කර තීරණය කිරීමේ වගකීම ද, වගන්ති අංක 19 යටතේ වූ උපරිම සිල්ලර මිල ගණන් නියම කිරීමේ වගකීම ද වගන්ති අංක 19 හා 20 යටතේ වූ අසාමාන්‍ය මිල ගණන්වලට භාණ්ඩ විකිණීමේ පැමිණිලිවලට අදාළව විභාග කර තීරණය කිරීමේ වගකීම ද මෙම සභාව සතුය.

### පාරිභෝගික කටයුතු සභාවේ සොමාජිකයන්

| | |
|---|---|
| උපාලි සේනාරත්න මහතා (නීතීඥ) | සභාපති |
| වසන්ත ගුණවර්ධන මහතා | සාමාජික |
| සුදත් විජේවික්‍රම මහතා | සාමාජික |
| ලේඛා ආර්යරත්න මහත්මිය (නීතිඥ) | සභාවේ ලේකම් |

## 2. අධිකාරියේ අභිමතාර්ථ

a. භාණ්ඩ අලෙවිකරණයේදී හෝ සේවාවන් ලබා දීමේදී පාරිභෝගිකයින්ගේ ජීවිත සහ දේපලවලට උපද්‍රව්‍ය පැමිණවිය හැකි ආකාරයේ තත්ත්වයන්ගෙන් පාරිභෝගිකයන් ආරක්ෂා කර ගැනීමට.

b. අසාධාරණ වෙළඳ චර්යාවන්ගෙන් පාරිභෝගිකයා ආරක්ෂා කර ගනිමින් පාරිභෝගික යහපත කෙරෙහි නිසි අවබෝධය යොමු කෙරෙන බව සහතික කිරීමට.

c. හැකි සෑම අවස්ථාවකදීම තරඟකාරී මිල ගණන් යටතේ භාණ්ඩ හා සේවාවන් ලබා ගැනීම සඳහා පාරිභෝගිකයින්ට ප්‍රමාණවත් ප්‍රවේශයක් පවතින බව සහතික කරගැනීමට.

d. අසාධාරණ වෙළඳ චර්යාවන්, සීමා ඇති කරවන සුළු වෙළඳ චර්යාවන් හෝ පාරිභෝගිකයින් සූරාකෑම සඳහා වෙළඳුන් වශයෙන් භාවිතා කරන වෙන යම් ක්‍රමයන්ට එරෙහිව සහන ඉල්ලා සිටීමට.

## 3. අධිකාරියේ කාර්යභාරය

1) පහත දැක්වෙන කරුණු පාලනය කිරීම හෝ තුරන් කිරීම.

a. ව්‍යවසායයන් අතර ඇතිවන බාධාකාරී වෙළඳ ගිවිසුම්
b. මිල සම්බන්ධයෙන් ව්‍යවසායන් අතර ඇති වන යම් යම් විධිවිධාන
c. වෙළඳපොල තුළ හෝ වෙළඳපොලේ සැලකිය යුතු අංශයක් තුළ දේශීය වෙළඳාම හෝ ආර්ථික සංවර්ධනය සම්බන්ධයෙන් තමන්ට ඇති ප්‍රමුඛස්ථානය අයුතු ලෙස භාවිතා කිරීම, හෝ
d. දේශීය හෝ ජාත්‍යන්තර වෙළඳාම හෝ ආර්ථික සංවර්ධනයට විනාශකාරී අන්දමෙන් බලපාන්නා වූ බාධක හෝ තරඟකාරිත්වය

2) තරඟකාරිත්ව විරෝධී චර්යාවන් සහ ප්‍රමුඛ ස්ථානය අයුතු ලෙස භාවිතා කිරීම් සම්බන්ධ සිදුවීම් පිළිබඳව විමර්ශනය කිරීම හෝ සොයා බැලීම.

3) භාණ්ඩ හෝ සේවාවන් සපයන පුද්ගලයින් අතරේ සඵලදායි තරඟකාරිත්වයක් පවත්වා ගෙන යාම හා එය ප්‍රවර්ධනය කිරීම.

4) මිල, භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමට ඇති හැකියාව සහ ඒවායේ සමානභාව මෙන්ම සපයනු ලබන වර්ග යනාදිය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්, මිලදී ගන්නන් සහ භාණ්ඩ හා සේවා භාවිතා කරන අනෙකුත් පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් සහ සුබසෙත ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම.

5) අලෙවියට ඇති භාණ්ඩ හා සේවාවන්ගේ ගුණාත්මකබව, ප්‍රමාණය, ප්‍රබලත්වය, පවිත්‍රතාව, තත්ත්වය සහ මිල පිළිබඳව පාරිභෝගිකයින් දැනුවත් කිරීම.

6) මෙම පනත යටතේ දක්වා ඇති ඕනෑම කාරණයක් හා සම්බන්ධයෙන් විමර්ශන සහ පරීක්ෂණ සිදු කිරීම.

7) තරඟකාරිත්වය ප්‍රබල නොවන අවස්ථාවන්හිදී වෙළඳපොලේ මිල තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම.

8) වෙළඳපල තත්ත්වයන් සහ පාරිභෝගික කටයුතු සම්බන්ධයෙන් අධ්‍යයනය සිදු කිරීමට භාර ගැනීම, වාර්තා ප්‍රකාශනය කිරීම සහ මහජනතාවට තොරතුරු ලබාදීම.

9) රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ කාර්යක්ෂම අධ්‍යයන සිදු කිරීමට භාර ගැනීම.

10) පාරිභෝගිකයින්ගේ මනා සෞඛ්‍යය, ආරක්ෂාව සහ සුරක්ෂිතබව සම්බන්ධයෙන් පාරිභෝගික දැනුවත්භාවය ප්‍රවර්ධනය

11) වෙළඳපොල තත්ත්ව සහ පාරිභෝගික කටයුතු සම්බන්ධයෙන් දෙන තොරතුරු අනෙකුත් ආයතන සමඟින් හුවමාරු කරගැනීම, ප්‍රවර්ධනය කිරීම.

12) පාරිභෝගික සංවිධාන පිහිටුවීම, ප්‍රවර්ධනය කිරීම, ඒ සඳහා සහාය දීම සහ එයට දිරිගැන්වීම.

13) අධිකාරිය විසින් ලබා දෙන යම් සේවාවන් සඳහා අදාල ගාස්තු අය කර ගැනීම.

14) අධිකාරියේ කාර්යභාරය ඉටු කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස අවශ්‍ය වන කමිටු පත් කිරීම සහ

15) අධිකාරියේ අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට සහ අධිකාරියට නියම කර ඇති කාර්යභාරය සඵලදායී ලෙස ඉටු කිරීමට අවශ්‍ය කෙරෙන ක්‍රියාවන් වෙත එම ක්‍රියාවන් නිසි පරිදි ඉෂ්ඨ කිරීම.

# 4. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යසාධනය

සංවිධාන ව්‍යුහයට අනුව අධ්‍යක්ෂවරුන් හය දෙනා සහ අභ්‍යන්තර විගණන අංශය යටතේ ක්‍රියාත්මක වන මූලික අංශ හයකින් අධිකාරිය සමන්විත වේ. ඒවා නම්:

1) පාරිභෝගික කටයුතු සහ තොරතුරු අංශය
2) අනුකූලවීම් සහ බලගැන්වීම අංශය
3) මිලකිරීම් සහ කළමනාකරණ අංශය
4) තරඟකාරිත්ව ප්‍රවර්ධන අංශය
5) මුදල් අංශය
6) මානව සම්පත් හා පරිපාලන අංශය
7) අභ්‍යන්තර විගණන අංශය

2014 වසරේදී පාරිභෝගික කටයුතු අධිකාරියේ කාර්යසාධනය පහත පරිද වේ

**1. හානිකර සහ බාල තත්ත්වයේ භාණ්ඩ හා සේවාවන්ගෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම.**

(a.) පනතේ 10 වන සහ 12 වන වගන්ති යටතේ නිකුත් කරන ලද නියෝග

**විධාන අංක 49-** පාරිභෝගික අධිකාරිය, සිසිල් බීම වර්ග, වතුර බෝතල් / ඛනිජ වතුර බෝතල්, කෑමට සුදුසු තෙල් වර්ග, දන්තාලේප, සියළු වර්ගයේ සබන්, ෂැම්පු, තීන්ත වර්ග, විදුලි ස්විච්, සොකට්ස්, සර්කිට් බ්‍රේකර්ස් ආදිය නිෂ්පාදනය කරන / බෙදාහරින හා ආනයනය කරන වෙළෙඳුන් වෙත ඉහත සඳහන් සියළු පාරිභෝගික භාණ්ඩවලට ආරක්ෂිත මුද්‍රාව අලවන ලෙස විධානයක් නිකුත් කර ඇත.

**විධාන අංක 50 -** පාරිභෝගික කටයුතු අධිකාරිය, ගොඩනැගිලි කර්මාන්තයේ පාවිච්චියට ගනු ලබන බෝතල්වල, ඇසුරුම්වල හෝ භාජනවල අසුරා ඇති තීන්ත වර්ග, වාර්නිෂ් වර්ග හා දියකළ හැකි ද්‍රාවක ආදිය නිෂ්පාදනය කරන හා අලෙවි කරන වෙළෙඳුන් වෙත ඉහත සියළු පාරිභෝගික භාණ්ඩවල කාණ්ඩ අංකය, නිෂ්පාදන දිනය, ප්‍රමාණය, කල් ඉකුත් වන දිනය හා උපරිම සිල්ලර මිල ආදී විස්තර පැහැදිලිව මුද්‍රාකර තබන ලෙස විධාන නිකුත් කර ඇත.

**විධාන අංක 51** - පාරිභෝගික කටයුතු අධිකාරිය, අලෙවියට නුසුදුසු බවට හඳුනාගෙන ඇති එහෙත් ඒවා විනාශ කිරීම සඳහා/ ඒවා ප්‍රති-අපනයන සඳහා නිෂ්පාදකයින්ගේ, ආනයන කරුවන්ගේ, බෙදාහරින්නන්ගේ, වෙළෙඳුන්ගේ ගුදම්වල, ගබඩාවල හෝ එවැනි වෙනත් ස්ථානයක, එකී භාණ්ඩවල නිෂ්පාදන වර්ගය වෙළෙඳ නාමය, බර /ප්‍රමාණය සහ ඒකක ප්‍රමාණ ආදී විස්තර අඩංගු භාණ්ඩ ලේඛනයක් නොපවත්වා, තබා නොගන්නා ලෙස විධාන නිකුත් කර ඇත.

**විධාන අංක 52**- පාරිභෝගික අධිකාරිය, අලෙවියට නුසුදුසු බවට /හෝ කල් ඉකුත්වීමෙන් අලෙවියට නුසුදුසු බවට හෝ මිනිස් පරිභෝජනයට නුසුදුසු බවට හෝ හඳුනාගෙන ඇති භාණ්ඩ , අලෙවිය සඳහා තබා ඇති, ප්‍රදර්ශනය කර තබා ඇති අනෙකුත් භාණ්ඩ සමඟ කිසිම අයුරින් මිශ්‍රව නොතැබිය යුතු බවට භාණ්ඩ නිෂ්පාදකයින්ට, ආනයනයකරුවන්ට, බෙදාහරින්නන්ට, සැපයුම්කරුවන්ට හා වෙළෙඳුන්ට විධාන නිකුත් කර ඇත.

(අ) පනතේ 20 (5) වගන්තිය යටතේ නිකුත් කර ඇති නියෝග

**නියෝග අංක 26 -** යටතෙහි සහල් වර්ග කීපයකට උපරිම සිල්ලර මිල පනවන ලදී.

**නියෝග අංක 27 -** යටතෙහි කුකුල් මස් සඳහා උපරිම සිල්ලර මිල පනවන ලදී.

**නියෝග අංක 28 -** යටතෙහි සම්පූර්ණ යොදය සහිත කිරිපිටිවලට පනවා තිබූ උපරිම සිල්ලර මිලට අදාළ (නියෝග 20) ගැසට් පත්‍රය අවලංගු කරන ලදී.

**නියෝගඅංක 29 -** යටතෙහි සහල් වගී කීපයකට උපරිම සිල්ලර මිල පනවන ලදී (නියෝග අංක 26 අවලංගු කරන ලදී)

(ආ) **ආයනයන කරන ලද බාල තත්ත්වයේ භාණ්ඩ අධීක්ෂණය**

බාල තත්ත්වයේ භාණ්ඩ රටට ඇතුල්වීම ඒවා රටට ඇතුල් වන ස්ථානයේදීම වළක්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ශ්‍රී ලංකා රේගුව සමගින් සම්බන්ධීකරණය කිරීමට කටයුතු කර තිබේ. ආනයන පරීක්ෂා කිරීමේ පටිපාටිය යටතේ සම්මතයන්ට අනුකූල නොවීම හේතුවෙන් භාණ්ඩ යළි අපනයනය කළ යුතු බවට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිර්දේශ කරනු ලැබූ එවන් සිදුවීම් අධීක්ෂණය කරන ලදී.

(ඇ) ජාතික මට්ටමේ කමිටු සඳහා අධිකාරියේ නියෝජනය ලබා දෙන ලද අතර පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති /නීති හඳුන්වාදීම සඳහා දායකත්වය සපයන ලදී.

සෞඛ්‍ය අමාත්‍යංශය, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, බලශක්ති අමාත්‍යාංශය සහ ආර්ථික සංවර්ධනය සඳහා වන ජාතික සභාව යනාදී ආයතන යටතේ මෙහෙයවන ජාතික මට්ටමේ කමිටු තුළ පාරිභෝගික කටයුතු අධිකාරිය තම නියෝජනය ලබා දෙන අතර එතුලින් පාරිභෝගිකයින් ආරක්ෂාව සඳහා නව ප්‍රතිපත්ති සහ නීති හඳුන්වාදීමේදී ඊට දායකත්වය සපයා තිබේ.

## 2. කූට ක්‍රියාවන්ගෙන් සහ අසාධාරණ වෙළඳ පරිචයන්ගෙන් පාරිභෝගිකයා ආරක්ෂා කර ගැනීම.

**අ.** ව්‍යාපාරික ප්‍රජාව වෙනුවෙන් පවත්වනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන්

සිවිල් සමාජය අරමුණු කරගෙන සිදු කරන වැඩසටහන් සමගින් දැනුවත්භාවය වර්ධනය කිරීම හරහා අවදානම් පාත්‍ර කණ්ඩායම් ආරක්ෂා කිරීම, වඩාත් ඉහළ තත්ත්වයකට ගෙන ඒම සහ බලගැන්වීම. තරඟකාරීත්වය ප්‍රවර්ධනය සඳහා වන වඩාත් ප්‍රබල ක්‍රමවේදයයි. සැලසුම් කරන ලද සහ සම්පාදනය කරන ලද වෙළඳුන් දැනුවත් කිරීමේ වැඩසටහන හරහා මෙය ක්‍රියාවට නංවා තිබේ.

2014 වර්ෂය තුළදී ව්‍යාපාරික ප්‍රජාව අරමුණු කරගෙන අධිකාරිය විසින් වැඩසටහන් හාරසිය හතක් ක්‍රියාත්මක කර තිබේ.

**1 වගුව - 2014 වසරේදී සිදු කරන ලද වෙළෙඳුන් දැනුවත් කිරීමේ වැඩසටහන**

| පළාත | දිස්ත්‍රික්කය | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | සහභාගිවූවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| මධ්‍යම පළාත | නුවර | 18 | 820 |
| | මාතලේ | 51 | 1121 |
| | නුවර එළිය | 4 | 190 |
| නැගෙනහිර පළාත | අම්පාර | 13 | 212 |
| | මඩකලපුව | 11 | 208 |
| | ත්‍රිකුණාමලය | 17 | 267 |
| උතුරු මැද පළාත | අනුරාධපුර | 11 | 271 |
| | පොළොන්නරුව | 14 | 385 |
| උතුරු පළාත | යාපනය | 7 | 119 |
| | වව්නියාව | 19 | 541 |
| වයඹ පළාත | කුරුණෑගල | 10 | 368 |
| | පුත්තලම | 4 | 219 |
| සබරගමු පළාත | කෑගල්ල | 3 | 106 |
| | රත්නපුර | 16 | 330 |
| දකුණු පළාත | ගාල්ල | 11 | 324 |
| | හම්බන්තොට | 8 | 191 |
| | මාතර | 83 | 3088 |
| ඌව පළාත | බදුල්ල | 15 | 639 |
| | මොණරාගල | 4 | 108 |
| බස්නාහිර පළාත | කොළඹ | 48 | 3964 |
| | ගම්පහ | 17 | 907 |
| | කළුතර | 23 | 718 |
| **එකතුව** | | **407** | **15,096** |

**මිල ගණන් අධීක්ෂණය කිරීම**

යම්කිසි භාණ්ඩයක් හෝ සේවාවක් ප්‍රජාවේ හෝ එහි කොටසක ජන ජීවිතයට අත්‍යවශ්‍ය වන බව ගරු අමාත්‍යවරයාගේ විශ්වාසය වන්නේ නම්, අධිකාරියේද උපදෙස් ලබාගෙන රජයේ ගැසට්පත්‍රයේ පල කර එකී භාණ්ඩය හෝ සේවාව විශේෂිත භාණ්ඩ හෝ සේවාවන් වශයෙන් නම් කිරීමට අමාත්‍යවරයාට හැකි වේ.

පහත දැක්වෙන භාණ්ඩ විශේෂ භාණ්ඩ වශයෙන් ලැයිස්තුගත කර තිබේ.

සිමෙන්ති, එල්පී ගෑස්, කිරිපිටි, සහල්, කුකුලු මස්, තිරිඟු පිටි, සුදුසීනි, වියලි මිරිස්, ලොකු ළූණු, රතු ළූණු, පරිප්පු, වියළි හාල්මැස්සන්, කඩල, මුංඇට, ටිං මාලු

මිල අධීක්ෂණය කිරීමේ අරමුණ ඇතිව, අත්‍යවශ්‍ය ආහාර භාණ්ඩ සම්බන්ධයෙන් කොළඹ සහ අනෙකුත් දිස්ත්‍රික්කවල නිරන්තරයෙන්ම ආවේක්ෂණ කටයුතු සිදු කරන ලදී. සමාලෝචිත වර්ෂය තුළදී එවැනි ආවේක්ෂණ 12 ක්ම සිදුකරන ලදී.

ආහාර වර්ග, එළවළු සහ මාළු යනාදී භාණ්ඩවල දෛනික මිල ගණන් පාදක කර ගනිමින් දිනපතා ම මිළ ගණන් පිළිබඳව විශ්ලේෂණ වාර්තාවක් ඉදිරිපත් කරනු ලබන අතර එවැනි වාර්තා 334 ක් දැනටමත් ඉදිරිපත් කර ඇත.

**ආ. වෙළඳපල වැටලීම් සහ විමර්ශන**

ලේබල් කිරීම පිළිබඳ ලබා දී ඇති උපදෙස් උල්ලංඝනය කිරීම, සටහන් කර ඇති මිලට වඩා ඉහළ මිලකට භාණ්ඩ විකිණීම, භාණ්ඩ අලෙවි කිරීමට ප්‍රතික්ෂේප කිරීම, තමන් සතුව භාණ්ඩ ඇති බව පිළිනොගැනීම, භාණ්ඩ සඟවා තැබීම, අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගැනීමකින් තොරව ඇතැම් භාණ්ඩයන් හි තොග හෝ සිල්ලර මිල ඉහළ දැමීම, මෙම භාණ්ඩ මිල ගණන් ලැයිස්තුව ප්‍රදර්ශනය නොකිරීම, භාණ්ඩ මිලදී ගන්නන්ට ලදුපත් නිකුත් නොකිරීම, රැවටීම සහගත හෝ කූට ක්‍රියාවන් සහ නිෂ්පාදකයින් / වෙළඳුන් විසින් සිදු කරන ව්‍යාජ නිදේශනය වැළැක්වීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය පනතේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව වැටලීම් සිදු කරනු ලැබේ. වැරදි කරනු ලබන වෙළඳුන් අදාල මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියට පමුණුවා නඩු පවරනු ලබන අතර, පනතේ අංක 60 දරන වගන්තිය යටතේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව ඔවුන්ට දඩ නියම කරනු ලැබේ.

සිදුකරන ලද වෙළඳපළ වැටලීම් සහ අධිකරණ මගින් නියම කරන ලද දඩ මුදල් සම්බන්ධයෙන් වන ප්‍රගතිය පහත 2 වගුවෙන් දක්වා තිබේ.

| සිදුකරන ලද ක්‍රියාකාරකම් (ඉලක්කය) | සිදුකරන ලද වැටලීම් සංඛ්‍යාව | නඩු සංඛ්‍යාව | නියම කරන ලද දඩ (රුපියල්) |
|---|---|---|---|
| වෙළඳපල වැටලීම් සහ විමර්ශන<br>10 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොළ විමර්ශන (පනතේ 10 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝග උල්ලංඝනය කිරීම.) | 3530 | 2757 | 8,946,590/- |
| 11 වන වගන්තිය යටතේ සිදු කරන වෙළෙඳපොළ විමර්ශන (සලකුණු කර ඇති මිලට වඩා වැඩි මිලකට විකිණීම) | 2203 | 1538 | 5,340,939/- |
| 12 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොළ විමර්ශන (ප්‍රමිතීන්ට අනුකූල නොවීම) | 133 | 127 | 523,357/- |
| 15 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොළ විමර්ශන | 38 | 23 | 93,000/- |
| 16 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොළ විමර්ශනය (යම් භාණ්ඩයක් තමන් සතුව ඇති බව පිළිනොගැනීම) | 20 | 30 | 112,000/- |
| 17 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොළ විමර්ශනය (භාණ්ඩ සඟවා තැබීම) | 01 | - | - |
| 18 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොළ විමර්ශනය (උපරිම සිල්ලර මිල උල්ලංඝනය කිරීම) | 89 | 19 | 130,000/- |
| 20 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොළ විමර්ශනය | 702 | 530 | 1,819,600/- |
| 26 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොළ විමර්ශනය (භාණ්ඩ මිල ගණන් ලැයිස්තුව ප්‍රදර්ශනය නොකිරීම) | 6711 | 7310 | 20,390,340/- |
| 28 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොළ විමර්ශනය (මිලදී ගන්නන්ට ලදුපත් නිකුත් නොකිරීම) | 13 | 36 | 39,500/- |
| 30 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොළ විමර්ශනය (නොමගයවන සුළු හෝ රැවටිලි සහගත හැසිරීම) | 3584 | 3128 | 13,846,500/- |
| 30 සහ 31 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොළ විමර්ශනය (රැවටිලි සහගත ක්‍රියා සහ නිදේශනය) | 2681 | 1995 | 9,789,244/- |
| 31 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොළ විමර්ශනය (නිදේශනය) | 2697 | 2711 | 11,265,800/- |
| **එකතුව** | **22,402** | **20,204** | **72,296,870/-** |

**2014 වසරේදී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදු කරන ලද විශේෂ වැටලීම්**



ෆැබ්රික් ඩයි යෙදූ පාන් කුඩු මිශ්‍රිත මිරිස් කුඩු ගබඩාවක් වැටලීම



පරිභෝජනයට නුසුදුසු පරිප්පු ඩයි කර ගබඩාකර තිබියදී වැටලීම



ආනයනික පරිභෝජනයට නුසුදුසු“ටොම් ටොම් ක්‍රැකර්” තොගයක් විකිණීම සඳහා ගබඩා කර තිබියදී වැටලීම



සිමෙන්ති ගබඩාවක නැවත සිමෙන්ති ඇසුරුම් කර විකිණීම සඳහා ගබඩා කර තිබියදී වැටලීම



සැමන් ටින්වල මිල, කල් ඉකුත් වීමේ දිනය හා නිෂ්පාදිත දිනය මකා නැවත මුද්‍රණය කරමින් සටිනවිටදී වැටලීම



පරිභෝජනයට නුසුදුසු හාල්මැස්සන් තොගයක් විකිණීමට ගබඩා කර තිබියදී වැටලීම

2014 වසරේදී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදු ක රන ලද වෙළඳපොල වැටලීම්




2014 වසරේදී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පනවන ලද දඩ



**3. අසාධාරණ වෙළඳ පරිචයන්ගෙන් බලපෑමට ලක්වූ පාරිභෝගිකයන්ට සහන සැලසීම.**

**අ.** පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.

පනතේ අංක 13 සහ 32 යන වගන්ති යටතේ වන විධිවිධාන මත පදනම් වෙමින් පාරිභෝගිකයින් විසින් සිදු කරනු ලබන පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත්වීමට පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් කටයුතු කරනු ලැබේ. නිෂ්පාදකයා හෝ අලෙවිකරු විසින් ගම්‍යාර්ථයෙන් හෝ වෙන යම් අයුරකින් ලබා දෙන වගකීමට හෝ සහතිකයට අනුකූල නොවන ලෙසින් සිදුවන සේවා සැපයුම සහ භාණ්ඩ අලෙවිය සම්බන්ධයෙන් සිදු කරනු ලබන පැමිණිලි පිළිබඳව විමර්ශන සිදු කිරීමට අධිකාරියට හැකිය.

2014 වසරේදී පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ලැබූ ප්‍රගතිය පහත 3 හා 4 වගුවලින් ඉදිරිපත් කර තිබේ.

**3 වගුව - 2014 වර්ෂය තුළදී කටයුතු කළ පැමිණිලි සංඛ්‍යාව**

| **ලැබූ පැමිණිලි** | **එකතුව** |
|---|---|
| තැපැල් මගින් | 1149 |
| දුරකථන ඇමතුම් මගින් | 276 |
| වැටලීම් ප්‍රධාන කාර්යාලය/දිස්ත්‍රික් කාර්යාලය | 275 |
| වෙනත් ආයතනවලට යොමු කළ පැමිණිලි | 114 |
| පරීක්ෂණවලට හා නීති මගින් කටයුතු කිරීමට යොමුකළ පැමිණිලි | 152 |
| දිස්ත්‍රික් කාර්යාලවලට යොමු කළ පැමිණිලි (පුද්ගලික සහන) | 42 |
| අවසන් කළ පැමිණිලි | 677 |
| ප්‍රතික්ෂේප වූ පැමිණිලි | 10 |
| පවත්වන ලද සාකච්ඡා | 510 |

(මෙයට පසුගිය වසරේ සිට ඉදිරියට ගෙනා පැමිණිලි ද ඇතුළත් වේ.)

4 වගුව - පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන

| **මහජන පැමිණිලි මත සිදු කරන ලද විමර්ශන** | |
|---|---|
| පැමිණිලි සංඛ්‍යාව | 230 |
| පසුගිය වසරේ/මාසයේ සිට ඉදිරියට ගෙනා පැමිණිලි | 88 |
| අළුත් පැමිණිලි | 142 |
| බේරුම් කරන ලද විමර්ශන | 28 |
| නිකුත් කළ නියෝග | 42 |
| බලගැන්වූ නියෝග | 18 |

(පසුගිය අවුරුද්දේ පැමිණිලි ඇතුළුව)

වැටලීම්වලට අමතරව උසාවි නඩු සංඛ්‍යාව 23 ක් වූ අතර එමගින් දඩ මුදල් වශයෙන් රු. 776,500 ක් උපයාගන්නා ලදී.

**උසාවි නඩු ප්‍රමාණය**

| **වර්ගය** | **වර්ෂය - 2014** |
|---|---|
| ගොණු කළ අලුත් නඩු | 23 |
| නඩුවලට පෙනී සිටීම | 523 |
| දඩ මුදල් (උසාවි නඩු) | රු. 776,500/- |
| විභාග වූ නඩු | 124 |

**4. පාරිභෝගිකයන් දැනුවත් කිරීම සහ බලගැන්වීම**

**අ.** පාරිභෝගික දැනුවත් කිරීමේ වැඩසටහන්

පාරිභෝගික අයිතිවාසිකම් සහ වගකීම්, දැනට බලපවත්නා පාරිභෝගික නීතිය, යහපත් පාරිභෝගික සාරධර්ම සහ සාධාරණ ව්‍යාපාර පරිචයන් යනාදිය පිළිබඳව මහජනතාවට දැනුම ලබා දීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් ඉලෙක්ට්‍රොනික සහ මුද්‍රිත මාධ්‍ය, සම්මන්ත්‍රණ සහ වැඩමුළු, ප්‍රදර්ශන යනාදිය භාවිතා කරනු ලැබේ. ඉහත සඳහන් කළ වැඩ සටහන් වලට අමතරව පාරිභෝගික කණ්ඩායම් සහ ව්‍යාපාරික ප්‍රජාවේ සහභාගිත්ව ඇතිව පාරිභෝගික අයිතිවාසිකම් දිනයද සමරනු ලැබේ. පාරිභෝගික අයිතිවාසිකම් සහ පනතේ දක්වා ඇති නීතිරීති හා රෙගුලාසි සම්බන්ධයෙන් දිවයින මුළුල්ලේම පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

**5 වගුව - මහජනතාව වෙනුවෙන් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්**

| පළාත | දිස්ත්‍රික්කය | වෙළඳුන් දැනුවත් කිරීම | මහජනතාව දැනුවත් කිරීම | පාසල් දැනුවත් කිරීම | ප්‍රදර්ශන | මාධ්‍ය වැඩසටහන් | වැඩමුළු - විශේෂ වැඩසටහන් |
|---|---|---|---|---|---|---|---|
| මධ්‍යම පළාත | නුවර | 18 | 12 | 02 | | | |
| | මාතලේ | 51 | 38 | 10 | | | |
| | නුවර එළිය | 04 | 20 | 09 | | | |
| නැගෙනහිර පළාත | අම්පාර | 13 | 08 | 32 | | | |
| | මඩකලපුව | 11 | 22 | 26 | 01 | | |
| | ත්‍රිකුණාමලය | 17 | 31 | 27 | | 04 | |
| උතුරු මැද පළාත | අනුරාධපුර | 11 | 30 | - | | | |
| | පොළොන්නරුව | 14 | 07 | 05 | | | |
| උතුරු පළාත | යාපනය | 07 | 05 | 13 | | | |
| | වව්නියාව | 19 | 12 | 10 | | | |
| වයඹ පළාත | කුරුණෑගල | 10 | 33 | 04 | | | |
| | පුත්තලම | 04 | 30 | 04 | | | |
| සබරගමු පළාත | කෑගල්ල | 03 | 48 | 10 | | | |
| | රත්නපුර | 16 | 14 | 09 | | | |
| දකුණු පළාත | ගාල්ල | 11 | 17 | 08 | | | |
| | හම්බන්තොට | 08 | 10 | - | 01 | 10 | |
| | මාතර | 83 | 57 | 14 | 02 | 01 | |
| ඌව පළාත | බදුල්ල | 15 | 09 | 05 | | | |
| | මොණරාගල | 04 | 07 | 04 | | | |
| බස්නාහිර පළාත | කොළඹ | 48 | 37 | 18 | 09 | 17 | 13 |
| | ගම්පහ | 17 | 20 | 06 | 03 | | |
| | කළුතර | 23 | 10 | 13 | | | 01 |
| **එකතුව** | | **407** | **477** | **229** | **16** | **32** | **14** |

6 වගුව - පාරිභෝගික සංවිධාන පිහිටුවීම.

| පළාත | දිස්ත්‍රික්කය | පාරිභෝගික සංගම් ප්‍රමාණය | | පාසල් පාරිභෝගික කව | |
|---|---|---|---|---|---|
| | | පිහිටුවා ඇති | ලියාපදිංචි කර ඇති | පිහිටුවා ඇති | ලියාපදිංචි කර ඇති |
| මධ්‍යම පළාත | නුවර | | | | |
| | මාතලේ | 4 | | 01 | |
| | නුවර එළිය | | | | |
| නැගෙනහිර පළාත | අම්පාර | | 01 | 04 | 04 |
| | මඩකලපුව | | | | |
| | ත්‍රිකුණාමලය | 15 | 06 | 04 | 01 |
| උතුරු මැද පළාත | අනුරාධපුර | | | | |
| | පොළොන්නරුව | | | | |
| උතුරු පළාත | යාපනය | | | | |
| | වව්නියාව | 09 | 08 | 07 | 09 |
| වයඹ පළාත | කුරුණෑගල | | | | |
| | පුත්තලම | | 01 | | |
| සබරගමු පළාත | කෑගල්ල | | | 02 | 02 |
| | රත්නපුර | | 02 | | 01 |
| දකුණු පළාත | ගාල්ල | 03 | | | |
| | හම්බන්තොට | | | | |
| | මාතර | 13 | 04 | | 01 |
| ඌව පළාත | බදුල්ල | | | 03 | |
| | මොණරාගල | | | | |
| බස්නාහිර පළාත | කොළඹ | 03 | 01 | 08 | |
| | ගම්පහ | 01 | 01 | | |
| | කළුතර | 01 | | 01 | |
| **එකතුව** | | **49** | **24** | **30** | **18** |

**පාරිභෝගික කටයුතු පිළිබඳ  අධිකාරිය විසින් පවත්වන ලද දැනුවත් කිරීම් වැඩසටහන් - 2014**



පාරිභෝගික අයිතීන් පිළිබඳ පාසල් දැනුවත් කිරීමේ වැඩසටහනක්



පාරිභෝගික නීති හා විධිවිධාන පිළිබඳ වෙළඳුන් දැනුවත් කිරීමේ වැඩසටහනක්



පොදු වෙළඳපලක් අසළ පවත්වන ලැබූ පාරිභෝගික දැනුවත් කිරීමේ ජංගම වැඩසටහනක්

5. **තරඟකාරිත්ව විරෝධී වෙළඳ පරිචයන්ගෙන් අලෙවිකරුවන් සහ නිෂ්පාදකයින් ආරක්ෂා කර ගැනීම සහ යහපත් තරඟකාරිත්වය ප්‍රවර්ධනය**

**තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම**

තරඟකාරිත්ව විරෝධී පරිචයන් පිළිබඳව 2014 වසරේදී අධිකාරියට ලැබුණු පැමිණිලි මත පදනම් වෙමින් විමර්ශන 24 ක් පැවැත්වීමට අධිකාරිය විසින් කටයුතු කර ඇති අතර එකී පැමිණිලි අතරින් පැමිණිලි 17 ක් මෙම කාලය තුළදී විමර්ශනය කර නිමා කර ඇති අතර තරඟකාරිත්ව විරෝධී පරිචයන් හැටියට හඳුනාගෙන ඇති තවත් පැමිණිලි 5 ක් පාරිභෝගික කටයුතු සභාවට යොමු කර තිබේ.

පවිත්‍රකාරක භාණ්ඩ නිෂ්පාදනය කරන ව්‍යවසායකයින් අතර අදාළ නිෂ්පාදන භාණ්ඩවලට ප්‍රමුඛස්ථාන ලබා ගැනීමේ තරගකාරීත්ව විරෝධී පරිචයක් තිබෙනවාදැයි නිෂ්චය කර ගැනීම සඳහා කරන ලද සමීක්ෂණයේදී, වෙළඳපොළ තුළ එවැනි ප්‍රමුඛස්ථායික/බලවත් සමාගම් තිබෙන බවට අනාවරණය වී ඇත. එහෙත් එකී පසුබිම තුළ තරඟකාරීත්ව විරෝධී පරිචයන් පවතින බවට වූ කිසිදු සාක්ෂියක් තිබෙන බවට තහවුරු වී නැති අතර එහිදී තරගකාරීත්ව නොවන මිල චර්යා කීපයක් ද දක්නට ලැබුණි.

තවද වෙළඳපොළෙහි සහල් මිල පිළිබඳව පවතින ගැටළුවලට හා පාරිභෝගික අධිකාරියේ සහල් මිල පාලන ක්‍රියාවලියට එය කෙසේ බලපාන්නේදැයි සොයා බැලීමට විශේෂ අධ්‍යයනයක් ආරම්භ කර ඇත.

**වෙළඳපල කොටස හඳුනාගැනීම සහ සංඛ්‍යානමය දත්ත එක්රැස් කිරීම.**

වෙළඳපොළේ හා වෙළඳපළේ සැලකිය යුතු කොටසක් තුළ අලෙවිය සම්බන්ධයෙන් තමන් දරන ප්‍රමුඛස්ථානය අයුතු ලෙස භාවිතා කිරීම පාලනය කිරීමේ හෝ තුරන් කිරීමේ වගකීම පාරිභෝගික කටයුතු අධිකාරිය සතු වේ. දේශීය වෙළඳපළෙහි දක්නට ඇති තෝරාගත් භාණ්ඩ සම්බන්ධයෙන් එකී ව්‍යාපාරවල වෙළඳපළ කොටස හඳුනාගැනීමට සහ තමන්ට ඇති ප්‍රමුඛස්ථානය අයුතු ලෙස භාවිතා කිරීමට ඇති ඉඩකඩ පිළිබඳව හඳුනාගැනීම සඳහා සංඛ්‍යාතමය දත්ත එක්රැස් කරන ලදී. එතුලින් එකී අංශ සහ කර්මාන්ත සම්බන්ධයෙන් පවතින වෙළඳපළ ව්‍යුහය හඳුනාගැනීමට පාරිභෝගික කටයුතු අධිකාරියට හැකි වී තිබේ. අදාළ වර්ෂය තුළ භාණ්ඩවලට අයත් වෙළඳපොළ කොටස ගණනය කිරීම සඳහා නිෂ්පාදන භාණ්ඩ 35 ක් නිශ්චය කරගනු ලැබූ අතර ආයතන 300 කට පමණ දැනුම් දෙන ලදී. මෙකී වෙළඳපොළ ඒකාධිකාරිත්වය අනුමානාත්මකව නිශ්චය කිරීම සඳහාද වෙනස් නොවූ වෙළඳ කොටස් නිර්නායකය අදාළ වේ. වෙළඳපොළෙහි තරඟකාරිත්වයක් නොමැති භාණ්ඩ වලට හා සේවාවලට අදාළව වෙළඳපොළ හඳුනාගැනීමේ ක්‍රියාවලියක් පැවතීම ඉතාම අත්‍යවශ්‍ය දෙයකි.

**දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීම.**

රසකැවිලි, චොක්ලට්, විස්කෝත, කේක් සහ සුවඳ සබන් ආනයනය කරන ආනයනකරුවන් තම උපරිම සිල්ලර මිල සඳහන් ප්‍රකාශ පාරිභෝගික කටයුතු අධිකාරිය වෙත යොමු කරනු ලැබේ. එසේ ප්‍රකාශ කරනු ලබන උපරිම සිල්ලර මිල පදනම් කරගනිමින් ඒ මත සෙස් බදු පැනවීමට රේගු දෙපාර්තමේන්තුවෙන් කටයුතු කරනු ලැබේ. මෙකී භාණ්ඩ සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කළ මිල ගණන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වන්නේදැයි සහතික කරගැනීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් නිරන්තර වෙළඳපොල පරීක්ෂාවන් සිදු කරනු ලැබේ. අදාල කාලසීමාව තුළ මෙවන් අයදුම්පත් 313 ක් සම්බන්ධයෙන් කටයුතු කර තිබේ. ශ්‍රී ලංකා රේගුව ඉහත සඳහන් භාණ්ඩ ආනයනය කිරීම හරහා සෙස් බද්ද හැටියට රුපියල් 457,100,205 /-ක ආදායමක් උපයාගෙන ඇත.

**කාර්යක්ෂම තොරතුරු සේවාවක් සහතික කිරීම**

අන්තර් ක්‍රියාකාරිත්ව ජංගම දුරකථන සේවය හරහා ජනතාවට උපරිම සිල්ලර මිල පිළිබඳ තොරතුරුලබාදීම - (කෙටි සංකේතය - 1977)

අදාළ වර්ෂය තුලදී පාරිභෝගික කටයුතු කෙටි සංඛේත අංකය වන 1977 හරහා ඉහත සේවය තවදරටත් ඉදිරියට ඉගන ගිය අතර එමගින් සිල්ලර වෙළඳ පොළෙහි (කොළඹ, පිටකොටුව, දෙමටගොඩ, බොරැල්ල නුගේගොඩ හා වැල්ලවත්ත ආදී ස්ථානවල) එළවළු, පළතුරු හා ආහාර භාණ්ඩවලට අදාළ දෛනික සිල්ලර මිළ ගණන් විස්තර පාරිභෝගිකයින්ට සපයන ලදී. ඒ අයුරින්ම මාළු මිළ ගණන් පෑලියගොඩ වෙළඳ පොළෙන් ලබාගෙන පාරිභෝගිකයින් දැනුවත් කර ඇත. මෙකී සිල්ලර මිල ගණන් තොරතුරු ඉහත පද්ධතියට දිනපතාම උත්පතනය කරනු ලබන එමගින් රටෙහි පාරිභෝගිකයින් පමණක් නොව ගොවීන්ද පිළිවෙළින් ඔවුන්ගේ මිළට ගැනීම් /අලෙවිය පිළිබඳ දැනුවත් භාවයකින් කටයුතු කිරීමට හැකිවී ඇත.

අදාළ අනෙකුත් නියාමන ආයතන සහ කොටස්කාර පාර්ශවයන් සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම.

01. පාරිසරික හා පුනර්ජනනීය අමාත්‍යංශය

ජාතික සම්බන්ධීකරණ කමිටු සාමාජික

පාතික හරිත ප්‍රසම්පාදක ප්‍රතිපත්ති හා උපදෙස් කමිටුවේ සාමාජික

ජාතික මෙහෙයවීමේ කමිටුව (NSC) සාමාජික

02. විදුලි සංදේශ සේවා හා තොරතුරු තාක්‍ෂණ අමාත්‍යාංශය

ව්‍යාපෘති මෙහෙයුම් කමිටු සාමාජික (PSC) සඳහා GIC 1919

03. සෞඛ්‍ය අමාත්‍යංශය

ආහාර උපදේශක කමිටු සාමාජික

04. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

සිමෙන්ති ප්‍රමිතිකරණ පිළිබඳ අංශික කමිටු රැස්වීම්

**සාධාරණ මිල සහතික කර ගැනීම**

අ. විශේෂිත භාණ්ඩවල මිල නියාමනය

පනතේ 18,19 සහ 20 දරන වගන්ති මගින් ලබා දී ඇති බලතල මත පදනම් වෙමින් හඳුනාගත් භාණ්ඩ වල වෙළඳපොළ මිල සම්බන්ධයෙන් මැදිහත්වීමට පාරිභෝගික අධිකාරිය කටයුතු කරනු ලැබේ. එකී තෝරාගත් භාණ්ඩ වල මිල ගණන් ස්ථාවර කිරීමට / ස්ථායි තත්ත්වයට ගෙන ඒමට පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව පහත7 වගුවෙන් ඉදිරිපත් කර තිබේ.

**7 වගුව - විශේෂිත භාණ්ඩවල මිල ස්ථාවර කිරීමට / ස්ථායි තත්ත්වයට ගෙන ඒමට පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග**

| භාණ්ඩය | ගනු ලැබූ ක්‍රියාමාර්ගය |
|---|---|
| සිමෙන්ති | සිමෙන්ති ඉල්ලුම්පත්‍ර එකක් (1) සඳහා තීරණය ලබා දී ඇත. |
| එල් පී ගෑස් | එල් පී ගෑස් ඉල්ලුම් පත්‍ර දෙකක් (2) සඳහා තීරණය ලබා දී ඇත. |
| සම්පූර්ණ යොදය සහිත කිරි පිටි | සම්පූර්ණ යොදය සහිත කිරිපිටි ඉල්ලුම් පත්‍ර හයක් (6) සඳහා තීරණය ලබා දී ඇත. |
| ඖෂධ වර්ග | ඖෂධ වර්ග ඉල්ලුම් පත්‍ර එකසිය නවයක් (109)සඳහා තීරණය ලබා දී ඇත. |

**අන්තර් නියෝග**

| භාණ්ඩය | ඉල්ලුම්පත්‍ර ගණන |
|---|---|
| ළදරු කිරි පිටි | 01 |
| තිරිඟු පිටි | 01 |
| ඖෂධ | 01 |

**ආ. සංවිධානයේ හැකියා ශක්තිය වැඩි දියුණු කිරීම.**

**අ. කාර්ය මණ්ඩලය සංවර්ධනය කිරීම.**

පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් තම කාර්ය මණ්ඩලය ඔවුන්ට අදාල වන එක් එක් ක්ෂේත්‍රයන් හරහා සංවර්ධනය කිරීම සලකනු ලබන්නේ අපගේ සේවාවන්ගේ ගුණාත්මක භාවය වර්ධනය කිරීමට දායක වන ආයෝජකයන් ලෙසය. 2014 වසරේදී කාර්යමණ්ඩලය සඳහා පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර පහත 08 වගුවෙන් ඉදිරිපත් කර තිබේ.

**8 වගුව - 2014 වසරේ පවත්වනු ලැබූ කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන්**

| අංකය | පාඨමාලාවේ නම | සහභාගිවූවන් ගණන |
|---|---|---|
| 01 | වාර්ෂික තොග පරීක්ෂීම හා ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ඉවත් කිරීම | 02 |
| 02 | මුදල් කළමණාකරණය හා මුදල් ගලා යාම පාලනය කිරීම | 01 |
| 03 | නිවාඩු දැමීමට අදාළ රාජකාරි භාරව කටයුතු කරන ලිපිකරුගේ රාජකාරි කටයුතු හා වගකීම් | 01 |
| 04 | ඵලදායි අභ්‍යන්තර විගණනය | 01 |
| 05 | ජාත්‍යන්තර මට්ටමේ සම්මන්ත්‍රණ නවීන තොරතුරු ව්‍යුහය තුල සංඛ්‍යාත සහ සමාජය | 01 |
| 06 | ගිණුම්පොත් ක්‍රමාණුකූලව පවත්වාගෙන යාම | 01 |
| 07 | ජාතික නෛතික සම්මන්ත්‍රණය - 2014 | 05 |
| 08 | ජාතික කළමණාකරණ සම්මන්ත්‍රණය - 2014 | 03 |
| 09 | මූල්‍ය ප්‍රකාශය, මුදල් ගලා යාම ප්‍රකාශය හා ස්ථාවර වත්කම් ඉදිරිපත් කිරීම | 03 |
| 10 | රජයේ කළමණාකරණ සහකරුවන්ගේ රාජකාරියට අදාළ වගකීම් | 03 |
| 11 | කාර්යාල සේවකයින්ගේ හා රියදුරන්ගේ කුසලතා වර්ධනය | 04 |
| 12 | රජයේ ගණකාධිකාරීවරුන්ට අදාළ ව්‍යුහාත්මක කළමණාකරණ වැඩසටහන් | 01 |
| 13 | දුරකථන සාරධර්ම හා පිළිගැනීම් සේවා | 01 |
| 14 | පාරිභෝගික සෞඛ්‍යය හා ආරක්ෂණ කටයුතු පිළිබඳ පුහුණ වැඩසටහන් | 64 |
| 15 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළ පුහුණු වීම් වැඩසටහන් | 67 |
| 16 | ප්‍රවාහන කළමණාකරණය | 01 |
| 17 | රජයේ පරිපාලන නිළධාරීන්ට අදාළ යහපත් කළමණාකරණ කුසලතා පිළිබඳ වැඩසටහන් | 01 |
| 18 | ආහාරවල පිරිසිදු භාවය හා ආරක්ෂණය පිළිබඳ වැඩමුළු | 04 |

ආ. අධිකාරියේ කාර්ය මණ්ඩලය ශක්තිමත් කරීම

| වැටුප් කේතය | තනතුර | 2011.05.19 වන දින වන විට අනුමත සේවක සංඛ්‍යාව | 2014.12.31 දින වන විට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| **HM 2-1** | **ජ්‍යෙෂ්ඨ කළමනාකරු** | | | |
| HM 1-1 | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| | අධ්‍යක්ෂ | 6 | 5 | 1 |
| | සභාවේ ලේකම් | 1 | 1 | 0 |
| **MM 1-1** | **කළමනාකරු** | | | |
| | අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 15 | 5 | 7 |
| | සහකාර අධ්‍යක්ෂ | | 3 | |
| | නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ/කලාප | 9 | 8 | 1 |
| **JM 1-1** | **කණිෂ්ඨ කළමනාකරු** | | | |
| | විගණන නිලධාරී | 2 | 0 | 2 |
| | පද්ධති පරිපාලක | 1 | 0 | 1 |
| | ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී | 27 | 24 | 3 |
| | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරී | 1 | 0 | 1 |
| | ජ්‍යෙෂ්ඨ වෙළඳපල සම්පත් විශ්ලේෂක | 1 | 0 | 1 |
| | ජ්‍යෙෂ්ඨ ගිණුම් නිලධාරී | 2 | 1 | 1 |
| | පෞද්ගලික ලේකම් (අධ්‍යක්ෂ ජනරාල්) | 1 | 0 | 1 |
| | පෞද්ගලික ලේකම් (සභාපති) | 1 | 1 | 0 |
| | ජ්‍යෙෂ්ඨ පරිපාලන/මානව සම්පත් නිලධාරී | 1 | 0 | 1 |
| | ජ්‍යෙෂ්ඨ නීති සහ බලාත්මක කිරීමේ නිලධාරී | 2 | 2 | 0 |
| | ජ්‍යෙෂ්ඨ පිරිවැයකරණ නිලධාරී | 1 | 0 | 1 |
| **MA 5-2** | **බලාත්මක කිරීම/මෙහෙයුම්/ ව්‍යාප්ති** | | | |
| | දත්ත සම්බන්ධීකාරක | 1 | 1 | 0 |
| | සංඛ්‍යාන නිලධාරී | 1 | 1 | 0 |
| | වෙළඳපළ සම්පත් විශ්ලේෂක | 1 | 1 | 0 |
| | ලේඛන සම්පාදක නිලධාරී | 6 | 4 | 2 |

| වැටුප් කේතය | තනතුර | 2011.05.19 වන දින වන විට අනුමත සේවක සංඛ්‍යාව | 2014.12.31 දින වන විට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| | පුස්තකාලයාධිපති | 1 | 1 | 0 |
| | පිරිවැයකරණ නිලධාරී | 15 | 3 | |
| | ගිණුම් නිලධාරී | | 9 | 3 |
| | පරිපාලන නිලධාරී | 5 | 3 | 2 |
| | නීති හා බලාත්මක කිරීමේ නිලධාරී | 3 | 2 | 1 |
| | විමර්ශන නිලධාරී | 200 | 179 | 21 |
| **MA 2-2** | **කළමනාකරණ සහකාර (තාක්ෂණික)** | | | |
| | පොත් තබන්නා | 1 | 0 | 1 |
| **MA 1-2** | **කළමනා කරණ සහකාර (තාක්ෂණික නොවන)** | | | |
| | කළමනාකරණ සහකාර | 31 | 31 | 0 |
| **PL 3** | **ප්‍රාථමික මට්ටමේ, නිපුණතා සහිත** | | | |
| | රියදුරු | 18 | 17 | 1 |
| **PL 1** | **ප්‍රාථමික මට්ටමේ නිපුණතා රහිත** | | | |
| | කාර්යාල සහායක | 14 | 14 | 0 |
| | එකතුව | 370 | 318 | 52 |

**ඇ. කාර්ය මණ්ඩලය දිරිගැන්වීම සහ සුභසාධනය**

ප්‍රසන්න සහ සේවය සැපයීමට පහසු කරන වැඩ පරිසරයක් කාර්ය මණ්ඩලය වෙනුවෙන් ලබා දීමේ අරමුණ ඇතිව වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, සංස්කෘතික සහ ආගමික වැඩසටහන්, කාර්ය මණ්ඩල දිරිගැන්වීමේ යෝජනා ක්‍රම, කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්, සේවකයින් ඇගයීමට ලක් කිරීමේ වැඩසටහන් යනාදී පියවර ගණනාවක් වසර මුළුල්ලේම පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.

**ඈ. පාරිභෝගික කටයුතු අධිකාරිය පනතට සිදුකරන ලද සංශෝධන**

යෝජිත සංශෝධන නියෝජ්‍ය නීති කෙටුම්පත් හා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර අවසන් කර ඇත.

## පාරිභෝගික කටයුතු සභාව - 2014

පාරිභෝගික කටයුතු සභාව පරිපාලනමය වශයෙන් ක්‍රියාත්මක වන්නේ පාරිභෝගික කටයුතු අධිකාරිය යටතේ වන අතර ප්‍රධාන වශයෙන් ම තරඟකාරීත්ව විරෝධී පරිචයන්ට අදාළව අධිකාරිය විසින් යොමු කරන කාරණා විභාග කිරීමටත් තීන්දු ලබා දීමටත් අවශ්‍ය බලය පනත මගින් සභාවට පවරා තිබේ. පනතේ විධිවිධාන ප්‍රකාරව අධික මිල ගණන් අය කිරීම, වෙළඳපළ දෝෂ සහ වෙළඳපළ හැසිරවීම යනාදිය සම්බන්ධ සිදුවීම් ද විමර්ශනය සඳහා මෙම සභාව වෙත යොමු කරනු ලැබේ. අවශ්‍ය කරන අවස්ථාවන්හිදී භාණ්ඩ හෝ සේවාවන් ලබා දිය හැකි උපරිම මිල සීමාවන් නිර්දේශ කිරීම සඳහා ද සභාවට බලය ලබා දී තිබේ.

### පැමිණිලි / යොමු කිරීම්

| පාරිභෝගික කටයුතු අධිකාරිය පනතේ අදාල වගන්තිය | පැමිණිලි / යොමු කිරීම් සංඛ්‍යාව | නිරවුල් කිරීම් / තීන්දු / නිර්දේශ |
|---|---|---|
| 38 වගන්තිය<br>තරඟකාරිත්ව විරෝධී පරිචයන් | 5 | නිරවුල් කිරීම් - 4<br>තීරණ - 2 |
| 19 වගන්තිය<br>භාණ්ඩ හා සේවාවන් සම්බන්ධයෙන් උපරිම මිල සීමාවක් නිර්දේශ කිරීම. | 2 | නිර්දේශ - 3 |
| 19 හා 22 වගන්ති<br>භාණ්ඩ හා සේවාවන් සඳහා ඉතා ඉහළ මිල ගණන් නියම කිරීම සම්බන්ධයෙන් සිදු කෙරෙන විමර්ශන | | නිර්දේශ - 1 |

(පසුගිය අවුරුද්දේ පැමිණිලි ඇතුළුව)

විශේෂ කාර්යයක් වශයෙන් 1977 ව්‍යාපෘතියේ දෛනික කාර්ය භාරය අධීක්ෂණය කිරීම සභාව විසින් සිදු කරනු ලබයි. ඒ අතර,

- මිල ගණන් පරීක්ෂා කර භාණ්ඩ මිල දර්ශනය යාවත්කාලීන කිරීම.
- පාරිභෝගික පැමිණිලි වල සාරාංශය පරීක්ෂා කිරීම.
- පද්ධතිය සුමට ලෙසත් පාරිභෝගික මිතුරු අන්දමටත් ක්‍රියාත්මක වන්නේදැයි අධීක්ෂණය කිරීම.

**2014 දෙසැම්බර් 31 වන දින වන විට පවතින මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | 31.12.2014 දිනට<br>රු. 000' | 31.12.2013 දිනට<br>රු. 000' |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම වත්කම්** | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 17,593 | 10,775 |
| ලැබිය යුතු වෙළඳ හා අනෙකුත් | 16,124 | 21,724 |
| ඉන්වෙන්ටරි / තොග | 2,110 | 1,538 |
| අනෙකුත් ජංගම මූල්‍ය වත්කම් | 6,138 | 14,759 |
| | **41,966** | **48,795** |
| නොනිමි වැඩ (සංවර්ධන අදියර) | 1,803 | 1,421 |
| **ජංගම නොවන වත්කම්** | | |
| ආයෝජන | 168,657 | 145,371 |
| පාරිතෝෂික අරමුදල් ආයෝජන ගිණුම | 16,682 | |
| ජංගම නොවන අනෙකුත් මූල්‍ය වත්කම් (සේවක මණ්ඩල ණය) | 8,251 | 8,254 |
| බද්දට ගත් ගොඩනැගිලි | 900 | 925 |
| දේපල, පිරියත හා උපකරණ | 55,693 | 57,777 |
| | 250,183 | 212,327 |
| මුළු වත්කම් | **293,951** | **262,544** |
| **වගකීම්** | | |
| ජංගම වගකීම් | | |
| උපචිත වියදම් | 23,038 | 16,025 |
| ගෙවිය යුතු හා අනෙකුත් වගකීම් | 6,096 | 5,435 |
| | **29,134** | **21,461** |
| **ජංගම නොවන වගකීම්** | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 26,176 | 21,458 |
| **මුළු වගකීම්** | 55,310 | 42,919 |
| මුළු ශුද්ධ වගකීම් | **238,641** | **219,625** |
| **ශුද්ධ වත්කම්/සම කොටස්** | | |
| සමුච්ජිත අරමුදල් | 63,191 | 63,191 |
| විලම්භිත ආදායම් | 52,535 | 57,517 |
| සංචිත | 122,915 | 98,917 |
| **මුළු ශුද්ධ වත්කම්/සම කොටස්** | **238,641** | **219,625** |

පිටු අංක 05 සිට 11 දක්වා තිබෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 12 සිට 46 දක්වා තිබෙන සටහන් ආදිය මෙහි සඳහන් මූල්‍ය ප්‍රකාශවලට අදාළ ප්‍රධාන කරුණුවේ. මෙකී මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ සම්පූර්ණ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතුවේ. එසේම මෙම මූල්‍ය ප්‍රකාශය අධක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් මෙහි අත්සන් යොදා ඇත.

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ මුදල් | අධ්‍යක්ෂ ජනරාල් | සභාපති |
| පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය |

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

**2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

| | 2014.12.31 දිනට<br>රු.000 | 2013.12.31 දිනට<br>රුඃ 000 |
|---|---|---|
| **ආදායම** | | |
| පුනරාවර්තන ප්‍රදාන | 249,973 | 226,408 |
| දඩ ආදායම | 21,641 | 28,513 |
| වෙනත් ආදායම් | 31,472 | 32,628 |
| | **303,086** | **287,549** |
| **වියදම්** | | |
| සේවක වැටුප් | (160,896) | (139,879) |
| ගමන් ගාස්තු | (12,496) | (12,172) |
| සැපයුම් හා පාරිභෝජ්‍ය භාණ්ඩ | (11,130) | (11,417) |
| නඩත්තු | (5,401) | (6,674) |
| කොන්ත්‍රාත් සේවා | (44,905) | (38,691) |
| ක්ෂය වීම් | (17,994) | (17,557) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (27,617) | (28,087) |
| මූල්‍ය පිරිවැය | (102) | (107) |
| වත්කම් බැහැර කිරීමෙන් ලද ලාභය (අලාභය) | -- | (148) |
| මුළු වියදම | (280,542) | (254,732) |
| අදාළ කාලය සඳහා ශුද්ධ අතිරික්තය (හිඟය) | **22,544** | **32,817** |

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

**2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. 000' | රු. 000' |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහය** | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් හරහා අතිරික්තය /හිඟය | 22,544 | 32,965 |
| වත්කම් බැහැර කිරීමෙන් ලද ලාභය /අලාභය | | (148) |
| **ගැලපුම්** | | |
| ක්ෂයවීම් | 17,994 | 17,556 |
| පාරිතෝෂික ප්‍රතිපාදනයන් | 5,137 | 4,603 |
| ක්‍රමක්ෂය | 25 | 25 |
| කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය | 45,700 | 55,001 |
| ගෙවිය යුතු ඒවායෙහි අඩුවීම් | 7,674 | (1,510) |
| අනෙකුත් ජංගම වත්කම්වල වැඩිවීම | 13,648 | (11,831) |
| පාරිතෝෂිත ගෙවීම් | (418) | (978) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | 66,604 | 40,682 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබෙන මුදල් ප්‍රවාහය** | | |
| පිරියත සහ උපකරණ මිලදී ගැනීම | (15,911) | (6,223) |
| අස්පෘශ්‍ය වත්කම්වල වැඩිවීම | (382) | (1421) |
| පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල | | 275 |
| පාරිතෝෂිත අරමුදලෙහි ආයෝජන | (16,682) | |
| ආයෝජන වල වැඩිවීම | (23,286) | (20,132) |
| දීර්ඝකාලීන ණය වල අඩුවීම | 3 | 185 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබුණ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(56,258)** | **(27,316)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලැබුණ මුදල් ප්‍රවාහ** | | |
| භාණ්ඩාගාර ප්‍රදාන මූලධන | 12,028 | 4,970 |
| ක්ෂයවීම් මූලධන | 17,010 | 18,740 |
| විලම්භිත ආදායම් | (4,982) | (13,770) |
| **පාරිභෝගික ආරක්ෂණ අරමුදල / සංචිත** | 1,454 | 1,314 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලැබුණ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(3,528)** | **(12,456)** |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩි වීම (අඩුවීම)** | **6818** | 910 |
| **කාලසීමාව ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ** | **10,775** | 9,865 |
| | **17,593** | **10,775** |

# ගිණුම් සඳහා සටහන්

## 1. ආයතනික තොරතුරු

1.1 1979 අංක 1 දරණ පාරිභෝගික ආරක්ෂණ පනත ද 1987 අංක 1 දරණ සාධාරණ මිල කොමිසම් පනත ද ඒ වගේම මිල පාලන පනතද (පරි. 173) අහෝසි කරමින් සම්මත කර ගන්නා ලද 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු අධිකාරිය පනත මගින් පාරිභෝගික කටයුතු අධිකාරිය ඇති කර තිබේ.

2011.09.15 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/58/02 අනුව පාරිභෝගික කටයුතු අධිකාරිය, නියාමන නියෝජිත ආයතන ව්‍යුහයේ "A" කාණ්ඩය යටතේ "A"උප කාණ්ඩය යටතේ වර්ගීකරණය වී ඇත.

1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය

අධිකාරියේ මූලික ක්‍රියාකාරකම් වනුයේ පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා වෙළඳාම නියාමනය කිරීමයි.

1.3 2014 වර්ෂ අවසානය වන විට අධිකාරියේ සේවයෙහි නියුතු කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව 319 ක් වේ.

1.4 සැලකිය යුතු කොටස් හිමිකම / සම කොටස්

පාරිභෝගික කටයුතු අධිකාරියට මූලික වශයෙන් මුදල් ප්‍රදාන ලබා දෙන්නේ මහා භාණ්ඩාගාරයෙන් වේ. අරමුදලෙහි ශුද්ධ ශේෂයෙන් 1/3 ක් සම්පාදනය වී ඇත්තේ දඩ ලෙස ලබන ආදායමින් වන අතර එය අධිකාරියට සෘජුවම ලැබෙන ආදායමක් වන අතර, එය අධිකාරියේ සම කොටස්වලට නියෝජනය වී තිබේ.

1.5 රජයේ ප්‍රදාන

යම් ප්‍රදානයක් ලැබෙනු ඇති බවට යුක්ති සහගත සහතිකයක් පවතින විට එවන් ලැබීම් රජයේ ප්‍රදාන ලෙස හඳුනාගනු ලැබේ. යම් ප්‍රදානයක් වියදම් අයිතමයකට සම්බන්ධ වේ නම්, එය වර්ෂය සඳහා වන ආදායමක් ලෙස පිළිගනු ලැබේ. ප්‍රදානය වත්කමකට සම්බන්ධ වන්නේ නම්, අදාල වත්කමේ ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය මුළුල්ලේම සමාන ප්‍රමාණවලින් ලැබෙතැයි අපේක්ෂිත ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

මුදල් නොවන වත්කමක් පාරිභෝගික කටයුතු අධිකාරිය වෙත ලැබුණු විට එකී වත්කමෙහි සහ ප්‍රදානයෙහි නාමික අගය සටහන් කරගෙන, වත්කමේ බලපවත්වන ප්‍රතිලාභය සමාන වාර්ෂික වාරික ලෙස පරිභෝජනය කිරීමේ රටාවක් අනුව එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලය මුළුල්ලේ ලාභ හෝ අලාභ වශයෙන් මුදා හරිනු ලැබේ. වත්කම් සහ සාධාරණ වටිනාකම මත ගණනය කරන ලද මුදල් නොවන ප්‍රදාන හා සම්බන්ධ වන රජයේ ප්‍රදාන විලම්භිත ආදායම වශයෙන් ශේෂපත්‍රය මගින් ඉදිරිපත් කර තිබේ.

## 2. පොදු ගිණුම් ප්‍රතිපත්ති

2.1 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙහි රජයේ ගිණුම් ප්‍රමිතීන් සඳහා වන කමිටුව විසින් නිකුත් කර ඇති රජයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිද්දෙන් පාරිභෝගික කටයුතු අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබේ.

2.2 සාධාරණ ලෙස වටිනාකම මනිනු ලැබූ මෝටර් වාහන හැරුණු කොට, මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට තිබේ.

2.3 දඩ ආදායම

2.3.1 අධිකාරියේ සාමාන්‍ය ක්‍රියාකාරකම් සඳහා දඩ ආදායම භාවිතා නොකළ හෙයින් මීට පෙර අවස්ථාවන්හිදී දඩ ආදායම මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් නොකරන ලදී. කෙසේ නමුත් 2011 වසරේ සිට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සහිතව මෙවැනි ආදායම් පරිහරණය කිරීමට පාරිභෝගික කටයුතු අධිකාරිය ආරම්භ කොට තිබේ. එම නිසා දඩ වශයෙන් ලැබෙන ආදායමද ආදායමක් ලෙස සලකනු ලබන අතර දඩ සම්බන්ධයෙන් වන සියලුම වියදම් සහ ආදායම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පෙන්නුම් කර තිබේ.

2.3.2 පාරිභෝගික කටයුතු අධිකාරියේ අදාල වැටලීම් නිලධාරීන් විසින් ලබා දෙන නඩු අංකය සහ, තම ප්‍රේෂණ සමගින් අදාල අධිකරණ විසින් එවනු ලබන නඩු අංක අතර ඇති යම් යම් අසමානතා හේතුවෙන් අධිකාරියට මුදල් ලැබුණද එකී මුදල දඩ ආදායමක් ලෙස හඳුනා නොගන්නා ඇතැම් අවස්ථාවන්ද තිබේ. එවන් අවස්ථාවන්හිදී එකී මුදල් සැබැවින්ම අධිකාරියට ලැබිය යුතු මුදල් වේ ද නැතහොත් වැරදීමකින් අධිකරණය විසින් ප්‍රේෂණය කර ඇත්ද යන්න නිශ්චය කර ගැනීමේ අරමුණ ඇතිව එම මුදල් විලම්භිත දඩ ආදායම නම් වූ ගිණුමට මාරු කිරීම සාමාන්‍ය සිරිත වේ. වර්ෂය අවසාන වන තෙක්ම එවන් මුදල් හඳුනාගැනීමකින් තොරව ගිණුමේ රැඳී තිබුණහොත් ඒවා පාරිභෝගික කටයුතු අධිකාරියේ පරිභෝගික ආරක්ෂණ අරමුදලට බැර කරනු ලැබේ.

2.4 මුදල් වර්ෂය

අධිකාරියේ මුදල් වර්ෂය ලෙස සලකනු ලබන්නේ දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන ලිත් වර්ෂයයි.

## 3. වත්කම් වල පදනම් සහ ඒවායේ තක්සේරුව

3.1.1 මෝටර් වාහන සම්බන්ධයෙන් හැරුණු විට පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් පිරිවැය ආදර්ශය එකී ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස භාවිතා කරනු ලැබේ.(SLPSAS 7)

3.1.2 දේපළ, පිරියත සහ උපකරණ පිරිවැය අනුව ප්‍රකාශ කෙරෙන අතර ඊට දේපළ පිරියත සහ උපකරණයන්හි කොටස් වෙනුවට නව කොටස් යෙදීම ද ඇතුලත් වන්නා වූ සමුච්චිත පිරිවැයේ ශුද්ධ අගයක් ලෙස දක්වනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ වල සැලකිය යුතු කොටසක් වෙනුවට නව කොටසක් යෙදීමට සිදු වන විට එම ඉවත් කර කොටස පිලිගැනීමෙන් ඉවත් කොට නව කොටස් එහි ප්‍රයෝජනවත් ආයු කාලය සහ ක්ෂයවීම්ද පිලිගැනීමට ලක් කරනු ඇත. අලුත්වැඩියා සහ නඩත්තු සඳහා පිරිවැය ඒවා දරන්නට වන අන්දමෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ හඳුනාගැනීමට ලක් කර තිබේ.

යළි තක්සේරුවේදී ඇති යම් අතිරික්තයක් වුවහොත් එය සම කොටස් සමුච්චිත ලෙස හඳුනාගෙන වත්කම් යලි තක්සේරු සංචිතයේ සමුච්චිත සම කොටස් ලෙස හඳුනාගනු ලැබේ.

3.1.3 දේපල පිරියත සහ උපකරණ වල පිරිවැය ලෙස සලකනු ලබන්නේ එම වත්කම් ඒවායින් ලබා ගැනීමට අපේක්ෂා කරන ප්‍රයෝජනය ලබා ගත හැකි මට්ටමට ගෙන ඒම සඳහා දරන්නට වන යම් වියදමක් වෙතොත් එයද ඇතුළුව මිලදී ගැනීමට හෝ ඉදිකිරීමට දරන්නට වූ පිරිවැය වේ.

3.1.4 ව්‍යාපාරය පවත්වාගෙන යාමට හෝ වත්කමක ආයු කාලය වර්ධනය කිරීමට භාවිතා කෙරුණු ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීමට, දීර්ඝ කිරීමට හෝ වැඩි දියුණු කිරීමට දරන්නට වූ පිරිවැය ප්‍රාග්ධන වියදම් ලෙස සලකා තිබේ.

3.1.5 අයවැය චක්‍රලේඛ අංක 150 ප්‍රකාරව 2012 වර්ෂය ආරම්භයේදී පාරිභෝගික කටයුතු අධිකාරියේ වාහන සංචිතයට වාහන 5 ක් (ටොයෝටා හයිඒස් වෑන් රථ 4 ක් සහ ටොයෝටා මෝටර් රථයක්) එකතු කරන ලදී. ඒ සඳහා වන රුපියල් 48,848,357 ක ඉන්වොයිසිය මුදල් නොවන ප්‍රදානයක් ලෙස සලකා සුදුසු පරිදි ගිණුම්ගත කර තිබේ.

3.1.6 කෙරෙමින් පවතින වැඩ (රු. 1,802,500)

මෘදුකාංග වැඩි දියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීමට පහත සඳහන් අයුරින් මුදල් වියදම් වී ඇත.

| | **ඇස්තමේන්තු කරන ලද මුළු වියදම රු.** | **අවසන් කරන ලද වැඩ රු.** | **අවසන් කිරීමට ඉතිරිව ඇති වැඩ 31.12.2014 ට රු.** |
|---|---:|---:|---:|
| HR පැකේජය | 165,000/- | 121,250/- | 43,750/- |
| ගිණුම්කරණ හා ඉන්වෙන්ටරි මෘදුකාංග | 1,000,000/- | 200,000/- | 800,000/- |
| ඖෂධානුබද්ධ මෘදුකාංග | 1,975,000/- | 1,481,250/- | 493,750/- |
| **එකතුව** | **3,140,000/-** | **1,802,500/-** | **1,337,500/-** |

3.2 ක්ෂයවීම්

අධිකාරිය විසින් අත්පත් කර ගනු ලබන සියලුම වත්කම් එකී වත්කම භාවිතයට ගත හැකි මාසයේ සිට ක්ෂය වීම ආරම්භ කරනු ලැබේ.

3.2.1 දේපළ පිරියත සහ උපකරණ වල ඇස්තමේන්තුගත ආයුකාලය තුළදී එහි පිරිවැය කපා හැරිය හැකි වන අන්දමින් සංගත පදනමකින් ක්ෂයවීම් සිදු කර තිබේ.

| | |
|---|---|
| කාර්යාලයේ ලී බඩු සහ සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 10% |
| පරිගණක උපකරණ | 20% |
| පරිගණක මෘදුකාංග, වෙබ් නිර්මාණය (අස්පෘශ්‍ය වත්කම්) | 20% |
| මෝටර් වාහන | 20% |
| කාර්යාලයේ වෙන් කිරීම් | 20% |
| පාරිභෝජන නොවන | 10% |

3.2.2 ක්ෂයවීම් ගණනය කිරීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය සරල රේඛීය ක්‍රමය භාවිතා කරනු ලබයි.

3.2.3 පුස්තකාල පොත් සඳහා ක්ෂයවීම් අඩු කරනු නොලැබේ.

3.2.4 වර්ෂයට අදාල ක්ෂයවීම් අගය විලම්භිත ආදායම් ගිණුමට මාරු කරනු ලැබේ.

3.3 ගොඩනැගිලි පරිශ්‍රය - කුරුණෑගල

පාරිභෝගික කටයුතු අධිකාරියේ කුරුණෑගල කාර්යාලය වෙත කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් විසින් පවරා ඇති ගොඩනැගිලි පරිශ්‍රය සඳහා ගෙවිය යුතු රුපියල් මිලියන 1 ක ගෙවීම වසර හතලිහක් මුළුල්ලේ ක්‍රමක්ෂය වී තිබේ.

3.4 ණයගැතියෝ සහ ලැබිය යුතු

උපලබ්ධි වෙතැයි ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණයට ණයගැතියෝ සහ ලැබිය යුතු අගයන් ප්‍රකාශ කර තිබේ.

3.5 පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් දෙකෙන් වඩා අඩු අගය අනුව ඉන්වෙන්ටරි තක්සේරු කර තිබේ.

3.6 මුදල් හා මුදල් සමාන දෑ

අත ඇති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ කෙටිකාලීන ආයෝජන මුදල් හා මුදල් සමාන දෑ යනුවෙන් අදහස් කෙරේ.

3.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී මුදල් හා මුදල් සමාන දෑ යන්නට ඇතුලත් වී ඇත්තේ අත ඇති මුදල් සහ බැංකුවේ තැන්පතු වේ.

3.7 ස්ථාවර තැන්පතු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ස්ථිර තැන්පතු ආයෝජන හැටියට වර්ගීකරණය වී ඇත. ස්ථාවර තැන්පතු අදාල කාලසීමාව තුළ ආපසු ලබානොගැනීම පිළිබඳව පසුගිය අත්දැකීම් පාරිභෝගික කටයුතු අධිකාරියට ඇති හෙයින් ස්ථාවර තැන්පතු වලින් බහුතරය අවම වශයෙන් වසර තුනක්වත් යනතුරු ඒ අයුරින්ම පැවතෙනු ඇතැයි නිගමනය කෙරේ. ස්ථිර තැන්පතු පිරිවැය මිලකට මනිනු ලැබේ.

## 4. වගකීම් සහ ප්‍රතිපාදන

4.1 ගෙවිය යුතු

ගෙවිය යුතු මුදල් ඒවායේ පිරිවැයට ප්‍රකාශ කර තිබේ.

4.2 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම

පාරිභෝගික කටයුතු අධිකාරිය සතුව ප්‍රතිලාභ අර්ථ දැක්වූ විශ්‍රාම සැලසුම් 2 ක් පවතින අතර එම සැලසුම් දෙක සඳහාම දායකත්වය දැරීම වුවමනා කෙරේ.

4.2.1 අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම - පාරිතෝෂික

පාරිතෝෂිකය යනු අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුමකි. අදාල නීති ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට අධිකාරිය බැඳී සිටී. මෙම බැඳීම ඉටු කරනු වස් ශේෂපත්‍රයේ ප්‍රතිපාදන ඉදිරියට ගෙන යනු ලබන අතර එය ගණනය කරනු ලබන්නේ සේවය කරන පළමු වසරෙන් ඇරඹී සම්පූර්ණ වන එක් එක් වර්ෂය වෙනුවෙන් කාර්ය මණ්ඩලයේ සියලු දෙනා විසින්ම මුදල් වර්ෂයේ අවසන් මාසයේදී ලබන මාසික වැටුප මත පදනම් වේ. වර්ෂය ආරම්භයේදී ඉදිරියට ගෙන ආ ප්‍රතිපාදන සහ වර්ෂය අවසානයේදී ඉදිරියට ගෙන යන ප්‍රතිපාදන අතර ඇතිවන වෙනස සම්බන්ධයෙන් ආදායම් ප්‍රකාශය හරහා කටයුතු කරනු ලැබේ.

පාරිතෝෂිකය සඳහා වන ප්‍රතිපාදන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව අවම වශයෙන් වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා ගණනය කරනු ලැබේ. ඒ අනුව 31.12.2014 දිනට අවුරුද්දකට වැඩියෙන් සේවය සම්පූර්ණකර ඇති සේවකයින් වෙනුවෙන් එකතුවූ ප්‍රතිපාදන වල වටිනාකම රු. 26,176,130.00 ක්ව පවතී.

කෙසේ නමුත් පාරිතෝෂික ප්‍රතිපාදන වෙනම ආයෝජනය කිරීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් දැන් අනුමැතිය ලබා ගෙන තිබේ. ඒ අනුව, අවුරුදු 5 කට වඩා සේවා කාලයක් ඇති සේවකයින් සඳහා වූ පාරිතෝෂික ප්‍රතිපාදන ආයෝජනය කළ යුතුවේ. මෙකී ආයෝජන පහත සඳහන් වේ.

| | රුපියල් |
|---|---|
| 31.12.2014 දිනට අවුරුදු පහට වැඩි | |
| සේවාකාලයක් ඇති සේවකයින් සඳහා වූ පාරිතෝෂික ප්‍රතිපාදන | 20,970,837.00 |
| 31.12.2014 දිනට ආයෝජනය | 16,681,743.00 |
| 31.12.2014 දිනට ආයෝජන සඳහා ඉතිරිවී ඇති මුදල | 4,289,094.00 |

භාණ්ඩාගාරයේ ප්‍රදානය ලැබුණු විට මෙකී ඉතිරි මුදල ආයෝජනය කෙරෙනු ඇත.

4.2.2 අර්ථකථනය කළ දායකත්ව සැලසුම් / සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාළ නීති සහ රෙගුලාසි ප්‍රකාරව සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් දායකත්වය සඳහා සුදුසුකම් ලබයි. සේවකයින් ආවරණය කෙරෙමින් අර්ථසාධක අරමුදලට සහ භාරකාර අරමුදලට සිදු කරන දායකත්වය ආදායම් ප්‍රකාශයේදී වියදම් ලෙස හඳුනා ගැනේ.

අධිකාරිය විසින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට සේවකයින්ගේ දළ වේතන වලින් පිළිවෙලින් සියයට පහළොවක් සහ සියයට තුනක් දායකත්වය දරනු ලැබේ.

## 5. ආදායම

**ආදායම් හඳුනාගැනීම**

ආදායම පාරිභෝගික කටයුතු අධිකාරියට ගලා එන්නේ ද යන්න සහ එය විශ්වසනීය අන්දමින් මැනිය හැකි වේද යන්න කාරණා මත පදනම් වෙමින් ආදායම හඳුනා ගනු ලැබේ.

අවුරුදු තුනකට වඩා පැරණි පහතින් දක්වා ඇති ලෙජර් ගිණුම් ශේෂයන් ආදායම් වාර්තාවට පවරා ඇත. එයට හේතු වී ඇත්තේ මේවාට අදාළ ලැබුම්කරුවන්ගෙන් කිසිම ප්‍රතිචාරයක් නොමැති හෙයිනි.

| | රුපියල් |
|---|---|
| ගංවතුරින් හානි ණය | (125.00) |
| ලැබිය යුතු ආදායම් | 768.00 |
| විශේෂ අත්තිකාරම් | 100.00 |
| **මුළු එකතුව** | **743.00** |

**පොලී ආදායම**

කල් පිරෙන තුරු හඳුනාගත් මූල්‍ය වත්කම් යනුවෙන් වර්ගීකරණය කරනු ලබන මූල්‍ය වත්කම්(ස්ථාවර තැන්පතු) ලබන මූල්‍ය වත්කම් හරහා ලැබෙන පොලිය පොලී ආදායම වශයෙන් නාමික පොලී අනුපාතය භාවිතා කරමින් වාර්තා කරනු ලැබේ.

**රජයේ ප්‍රදාන**

ප්‍රදානය ලැබෙනු ඇතැයි සාධාරණ සහතිකයක් පවතින විට සහ ඒ හා සම්බන්ධ වන සියලුම කොන්දේසිවලට අනුව කටයුතු කරන විට ඒ අනුව රජයේ ප්‍රදාන හඳුනාගනු ලැබේ. යම් ප්‍රදානයක් වියදම් අයිතමයකට සම්බන්ධ වේ නම් (පුනරාවර්තන ප්‍රදාන) එය අදාළ කාල සීමාව තුළ ලැබෙන ආදායමක් ලෙස හඳුනා ගනු ලැබේ. ප්‍රදානය යම් වත්කම් අයිතමයක් සමගින් සම්බන්ධ වන විට (ප්‍රාග්ධන ප්‍රදාන) එය විලම්භිත ආදායමක් ලෙස හඳුනාගනු ලබන අතර අදාළ වත්කමේ අපේක්ෂිත ආයු කාලය මුළුල්ලේ සමාන ප්‍රමාණයන්ගෙන් මුදා හැරෙන ආදායම් ලෙස සලකනු ලැබේ.

පාරිභෝගික කටයුතු අධිකාරියට මුදල් නොවන ප්‍රදානයන් ලැබෙන විටදී එම වත්කම් සහ ප්‍රදානයක් ඒවායේ නාමික අගයට වාර්තා කරගනු ලබන අතර එකී වත්කමෙහි අපේක්ෂිත ආයු කාලය මුළුල්ලේ ආදායම් ප්‍රකාශයට මුදා හැරෙනු ඇත. (අයිඒඑස් 20)

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**


මගේ අංකය / எனது இல. / My No. } පීසී/ඊ/සීඒඒ/එෆ්ඒ/2014 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2015 අගෝස්තු 24දින..

සභාපති,

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 50(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති - 02**

වර්ෂය තුළ මුදල් ගලායාම හා මුදල් ගලාඒම් පිළිබිඹු වන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු නමුත් පිළියෙල කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පහත දුර්වලතා නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ගලාඒම් රු.12,027,338 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුල විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කර තිබූ මූල්‍ය චලනයට බලනොපාන ක්‍රමක්ෂය රු.17,009,798 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී සැලකිල්ලට ගෙන ගැලපීම් සිදුකළ යුතු නමුත් විලම්භිත ආදායම් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ අතර වෙනස මුදල් ගලායාමක් ලෙස සළකා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති - 03

පූර්ව කාලපරිච්ඡේදයේ සිදුවූ ගිණුම්කරණ වැරදි, වරද සිදුවූ කාලපරිච්ඡේදයේ සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීම හා ඒවා හෙළිදරව් කළ යුතු වුවද, රු.2,852,501 ක් වූ පූර්ව කාලපරිච්ඡේදයේ සිදුවූ වැරදි අතීතානුයෝගීව ගැලපීම වෙනුවට ප්‍රවර්තන වර්ෂයේ අතිරික්තයට ගලපා තිබුණි.

**2.2.2 නොපැහැදිලි පාලන ගිණුම්**

දිස්ත්‍රික් කාර්යාල වෙතින් එවූ තොරතුරු හා ශේෂ සනාථ කිරීම් අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උපාය දූත අත්තිකාරම් මුදල් ශේෂය රු.848,736 ක් වුවද, ගිණුමේ එම ශේෂය රු.906,500 ක් ලෙස දැක්වීම නිසා ජංගම වත්කම් රු.57,764 කින් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ වැඩ කටයුතුවලින් වූ මෙහෙයුම් ප්‍රතිඵලය රු.22,544,089 ක අතිරික්තයක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.32,816,755 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,272,666 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව දඩ මුදල් ආදායම රු.6,873,226 කින්ද, වෙනත් ආදායම් රු.1,155,326 කින් අඩුවීම, පෞද්ගලික පඩිනඩි රු.21,017,070 කින් වැඩිවීම මෙම පිරිහීම කෙරෙහි බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාරිභෝගික සේවා ව්‍යාපෘතිය සඳහා භාණ්ඩාගාර අනුමැතිය හා ප්‍රතිපාදන ලැබී නොතිබිය දී ඒ සඳහා අධිකාරියේ පාරිභෝගික ආරක්ෂණ අරමුදල් ගිණුමින් රු.5,401,427 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැයකර තිබුණි.

(ආ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ දක්වා තිබූ සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳව විශිෂ්ටත්වයන් ලැබූ සාමාජිකයන් 10 දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත විය යුතු වුවද, අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සිටිය යුතු උපරිම සාමාජික සංඛ්‍යාව පනතේ දක්වා නොතිබුණි. මේ හේතුවෙන් ආයතනයේ ප්‍රමාණය සහ සීමාවන් නොසලකා අධ්‍යක්ෂවරුන් 31 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුළ අධිකාරියට පත් කර ගෙන තිබූ බැවින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දීමනා සඳහා පමණක් සමාලෝචිත වර්ෂයේදී රු.1,792,230 ක මුදලක් වැය වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ සේවය කළ අධ්‍යක්ෂවරු 31 දෙනාගෙන් 11 දෙනෙකු පාරිභෝගික අධිකාරි පනතේ සඳහන් කළ සුදුසුකම් හා එහි ක්ෂේත්‍රවල පළපුරුද්ද හා විශිෂ්ටත්වය ලබා නොතිබූ පුද්ගලයන් වූ අතර එම පුද්ගලයන්ගෙන් 02 දෙනෙකු අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන ඖෂධ වැඩ සටහනේ ඖෂධ මිල තීරණය කිරීමේ පූර්ණ කාලීන කමිටුවේ සාමාජිකයන් ලෙසද කටයුතු කර තිබුණි.

(ඈ) අධිකාරියේ සභාපතිවරයාගේ කාර්යාලය නවීකරණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තු කර නොතිබුණු එකතුව රු.1,628,850 ක ලී බඩු හදිසි මිලදී ගැනීම ලෙස සලකා මිලදී ගෙන තිබුණි.

(ඉ) පාරිභෝගික කටයුතු හා තොරතුරු අංශය මගින් පවත්වන ප්‍රදර්ශන සඳහා ජංගම ප්‍රදර්ශන කුටියක් නිර්මාණය කිරීමට සීමිත මිල ගණන් කැඳවා තිබුණි. ඒ සඳහා සමාගමකින් ඉදිරිපත් කරන ලද රු.295,000 ක අවම මිල ලංසු ඇගැයීමේ දී සලකා බැලීමකින් තොරව වෙනත් සමාගමකින් එවන ලද රු.628,447 ක මුදලකට අදාළ කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**(අ) සහල්**

අධිකාරිය විසින් පනවා ඇති සහල් මිල පාලනයන් කෙරෙහි සැලකිල්ලක් නොදක්වා සහල් නිෂ්පාදකයන් සහ වෙළඳුන්, සිය අභිමතය පරිදි සමාලෝචිත වර්ෂය තුළ සහල් මිල නියම කර තිබුණි. අධිකාරිය විසින් මිල පාලනය ක්‍රියාත්මක කිරීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ වැටලීම් 1,329 ක් සිදුකර තිබුණ ද මෙමගින් ප්‍රමාණවත් පරිදි රටේ සහල්වල මිල පාලනය කිරීම සාර්ථක වී

නොතිබුණි. 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 19 වැනි වගන්තිය ප්‍රකාරව, සහල් මිල වැඩි වීම පාරිභෝගිකයන් කෙරෙහි සැලකිය යුතු ආකාරයෙන් බලපෑම නිසා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා එය විමර්ශනය කර වාර්තා කිරීමට පාරිභෝගික සභාව වෙත යොමුකර එකී සභාවේ නිර්දේශ මත සහල් මිල වැඩි කිරීම සඳහා ගැසට් නිවේදනයක් නිකුත් කළ යුතු වුවත්, එසේ සභාවේ අනුමැතියකින් තොරව ගැසට් නිවේදනයක් නිකුත් කර තිබුණු බවට තවදුරටත් අනාවරණය විය.

**(ආ) පානීය ජල බෝතල්**

---

2012 වර්ෂයේ සිට අධිකාරිය විසින් පානීය ජල බෝතල් සම්බන්ධයෙන් අධ්‍යයනයන් හා පරීක්ෂාවන් සිදුකරමින් තිබුණද, විගණිත දින වන විටත් අධිකාරිය හා පාරිභෝගික සභාව විසින් පානීය ජල බෝතල් වල ප්‍රමිතිය හා උපරිම මිල සම්බන්ධව නීති රීති පිළියෙල කර නොතිබුණි. මෙම හේතුව මත ප්‍රමිතියෙන් තොර හා විවිධ මිල ගණන් යටතේ වෙළඳපල තුළ පානීය ජල බෝතල් අලෙවි කරන අතර සමාලෝචිත වර්ෂය තුළ සන්නාම 08 (Brand) කින් යුත් පානීය ජල බෝතල් පාරිභෝගිකයාට නුසුදුසු තත්ත්වයක පැවති බව අධිකාරිය විසින් සිදුකළ නියැදි පරීක්ෂාවේදී අනාවරණය වී තිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

වටිනාකම රු.995,200 ක් වූ වීඩියෝ කැමරාවක් සහ කැමරා 09 ක් සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් සිට විගණිත දිනය වූ 2015 මාර්තු 25 දක්වා භාවිතා කිරීමකින් තොරව ගබඩාවේ නිෂ්ක්‍රීයව පැවතුණි.

**4.4 ආර්ථික නොවූ ගනුදෙනු**

---

භාවිතා නොකරන ස්ථාවර දුරකථන 21 ක් වෙනුවෙන් 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ස්ථාවර ගාස්තු ලෙස එකතුව රු.469,519 ක් ගෙවා තිබුණි.

**4.5 හඳුනාගන්නා ලද පාඩු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

අධිකාරිය විසින් 2011 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා ගොඩනැගිලි කුලී ලෙස එකතුව රු.1,794,880 ක් සමුපකාර තොග වෙළඳ සංස්ථාව වෙත වැඩිපුර ගෙවා තිබූ අතර, ඒ මත වැට් බදු ලෙස රු.219,693 ක්ද, ජාතිය ගොඩනැගීමේ බදු ලෙස රු.35,897 ක්ද, ගෙවා තිබුණි.එසේ වුවද, 2015 මැයි 15 දින වන විටත් එලෙස වැඩිපුර ගෙවා තිබූ මුදල් මාසික ගොඩනැගිලි කුලී මුදල් වලින් හිලව් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2015 මැයි 29 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) වත්කම් මිලදී ගැනීම.
(ආ) ඉන්වෙන්ට්‍රි පාලනය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

**<u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ සභාපතිවරයාගේ අදහස් දැක්වීම</u>**

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2014.12.31 දිනට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් හෝ අවසන් වර්ෂය සඳහා අංක 2.2.1 හි සඳහන් කරුණුවලට හැර ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව විගණකාධිපති විසින් ප්‍රකාශ කර ඇතිබව සතුටින් සඳහන් කරමි.

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02**

i. මුදල් ප්‍රවාහය සැකසීමේදී ප්‍රාග්ධන ගලාඒම වූ රු.12,027,338/- සැලකිල්ලට ගෙන ඇත. කෙසේ වෙතත් මෙම මුදල තනි අයිතමයක් ලෙස මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය තුල වෙනම දක්වා නැති අතර මෙම ගිණුම හා සම්බන්ධ අනෙක් ගිණුමට (වත්කම්) අදාල ක්‍රමක්ෂය වූ රු. 17,009,798/- හා ගලපා එන ශුද්ධ අගය (රු.17,009,798/- - රු.12,027,338/-) වූ රු. 4,982,458/73 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම යටතේ ඇති විලම්භිත ආදායම අඩුවීමක් ලෙස දක්වා ඇත.

ඉදිරියේදී මෙම අයිතමයන් වෙන් වෙන්ව මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් කරනු ඇත.

ii. ඉහත 1හි සඳහන් පැහැදිලි කිරීම අනුව මෙම ක්‍රමක්ෂය ප්‍රමාණය වූ රු. 17,009.798/- සැලකිල්ලට ගෙන ඇති බව පැහැදිලි වේ.

**ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක - 03**

පූර්වකාල පරිච්ඡේදයේ සිදුවූ ගිණුම්කරණ වැරදිමක් තිබේනම් ඒවා ප්‍රවර්තන වර්ෂයට ගැලපීම වෙනුවට අතීතානුයෝගීව ගැලපීම සඳහා ඉදිරියේදී කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් දී ඇත. ඒ අනුව ඉදිරියේදී මෙවැනි මතගැටීම් වැලැක්වෙනු ඇතිබව විශ්වාස කරමි.

**2.2.2 නොසැසඳුන පාලන ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උපායදූත අත්තිකාරම මුදල් ශේෂය රු. 848,736/- වන අතර එම ප්‍රමාණයටම අදාල ශේෂ සනාථ කිරීමද තිබුණු අතර එය විගණයටද ඉදිරිපත් කර තිබුණි.

**2.2.3 <u>නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

(අ) 19 වැනි වගන්තිය - පිළිගනිමි. සහල් සම්බන්ධ වෙළඳපල විෂමතාවයක් පවතින බව පෙනී ගිය අවස්ථාවක් හෙයින් අවශ්‍යතාවය මත මහජන සුභ සිද්ධිය සඳහා මෙවැනි හදිසි තීරණයක් ගැනිණි.

(ආ) 19 (2) වගන්තිය - අවුරුදු 1 ½ ක් නොව මාස 08ක් ප්‍රමාදවී ඇත. කෙසේවෙතත් 2014.07.30 වන දින නිර්දේශයන් අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.

**3. මූල්‍ය සමාලෝචනය**

3.1 මූල්‍ය ප්‍රතිඵල

2014 මූල්‍ය ප්‍රකාශ අනුව මෙහෙයුම ප්‍රතිඵල රු. 22,544,089/-ක අතිරික්තයකි. පෙර වර්ෂයට සාපේක්ෂව රු10,272,666/-ක අඩුවීමක් ඇති අතර ඊට හේතුව පුද්ගල පඩිනඩි ප්‍රමාණය අපේක්ෂිත ප්‍රමාණයට (රු.3000/- දීමනාවක් ගෙවීම) වඩා වැඩිවීමත් දඩමුදල් මුදල් ආදායම පෙර වසරට සාපේක්ෂව අඩුවීමත්ය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) 49 (3)වගන්තිය ප්‍රකාරව පාරිභෝගික අරමුදලේ මුදල් වියදම් කිරීමේ බලය පාරිභෝගික අධිකාරිය වෙත පැවරී ඇති බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් පමණක් මෙම වියදම දරන ලදී. ඉදිරියේදී අරමුදලින් වියදම් දැරීමේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට අමතරව භාණ්ඩාගාර එකඟතාවයද ලබාගන්නා බව සඳහන් කරමි.

(ආ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත සංශෝධනය සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් මේවන විටත් නීති කෙටුම්පත් අංශය වෙත යොමු කර ඇති අතර, මෙම සංශෝධනයන් අතර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාව 21ක උපරිමයකට සීමා කර ඇත. ඒ අනුව මෙම ගැටළුව මෙමගින් නිරාකරණය කරගත හැකි වනු ඇත.

(ඇ) මෙම තත්ත්වය පිළිගන්නා අතර මේ වන විට සඳහන් කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය තුල අන්තර්ගත නොවේ. කෙසේවෙතත් ඉදිරියේදී මෙවැනි කමිටුවලට පත්කිරීමේදී විශේෂයෙන් ඖෂධ මිල තීරණය කිරීම සම්බන්ධයෙන් වන කමිටුවලට එම ඖෂධ පිළිබඳ දැනුමක් ඇති අය පත්කරගැනීම අවශ්‍ය බව අමාත්‍යාංශ ලේකම් මගින් ගරු අමාත්‍යතුමා දැනුවත් කිරීමට අවශ්‍ය පියවර දැනටමත් ගෙන ඇත.

(ඈ) අධිකාරියේ (සභාපතිවරයාගේ) කාර්යාල පරිශ්‍රය නවීකරණය කිරීම අධිකාරියේ වියදමින් සිදුනොවන නිසා එය ඇස්තමේන්තුගත නොකරන ලදී. කෙසේවෙතත්, මෙම නවීකරණය කිරීමත් සමග ඊට අනුචිත කාර්යාල උපකරණ මිලදී ගැනීමට සිදු වූයෙන් හදිසි අවශ්‍යතාවයක් සේ සලකා තිබූ වෙනත් ප්‍රතිපාදන උපයෝගී කොටගෙන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් මත මෙම මිලදීගැනීම සිදු කරන ලදී.

(ඉ) මෙම මිළ කැඳවීම් සඳහා අවසන් දිනය ලෙස දැනුම් දී ඇත්තේ 2014.11.17 වන දිනයයි. නමුත් අවම මිළක් ඉදිරිපත් කර ඇති සමාගම අදාල මිළ කැඳවුම පාරිභෝගික අධිකාරියට ලැබී ඇත්තේ 2014.11.19යි. එමෙන්ම එකී සමාගමෙන් ප්‍රමාදවී එවන ලද මිළ කැඳවුමේ අප විසින් මිළ විමසුම් කරනු ලැබූ පිරිවිතරයන් හා විස්තරාත්මක තොරතුරුද සපයා නොමැත. එම නිසා අවසන් ඇගයීමේදී එම මිළ කැඳවුම සැලකිල්ලට නොගැණිනි.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) සහල්
වර්තමාන වෙළඳපලේ සහල් මිළ පාලනය කිරීමේදී පහත සඳහන් ප්‍රායෝගික තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවේ.

i. නියගය හේතුවෙන් නිෂ්පාදන හිගයක් ඇතිවීම - 2013 වර්ෂයේ වී අස්වැන්න අඩුවූ නිසා සහල් සැපයුමේ හිගයක් ඇතිවිය.

ii. වී සඳහා වූ සහතික මිලක් නියම කිරීම - සහල් නිෂ්පාදනය සඳහා වී කිලෝ 1.66ක් සහ අනෙකුත් වියදම් සැලකිල්ලට ගැනීමේදී සහල් කිලෝවක නිෂ්පාදන මිල, පාලන මිල ඉක්මවීම සහ

iii. සහල් ආනයනය කිරීම - රජය විසින් අවශ්‍යතාවය අනුව ඉහත තත්ත්වයන් පාලනය කිරීම සඳහා සහල් ආනයනය කිරීම. ඒ අනුව සහල් සැපයුම වැඩිවී වී මිළ අඩුවේ. නමුත් මෙය නිශ්චිත නොවන අතර පනවා ඇති පාලන මිළට සමාන අගයකට වෙළඳපළ තුල මිල තීරණය නොවේ.

ඉහත තත්ත්වය අනුව සහල් මිළ උච්චාවචනයන් වන අතර සහල් මිළ පාලනය ප්‍රායෝගිකව අපහසුවී ඇතිබව පැහැදිළි වේ. මෙවැනි අවිනිශ්චිත තත්ත්වයක් තුල සහල් මිළ පිළිබඳ ගැසට් නිවේදනය සංශෝධනය කිරීමද ප්‍රායෝගික නොවේ. කෙසේවෙතත් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සහල් මිළ පිළිබඳව

අධ්‍යයනයන් කරමින් සිටින අතර අවශ්‍ය අවස්ථාවලදී වෙළඳපල වැටලීම්ද කරනු ලබයි. සහල් ආනයනය සහ වී සඳහා වූ සහතික මිළ යම් නිශ්චිත මට්ටමකට ප්‍රායෝගිකව පැමිණීමේදී සහල් සඳහා වූ නව පාලන මිලක් ඇතිකිරීම හෝ එසේ නොවන්නේ නම් මෙම ගැසට් නිවේදනය අවලංගු කිරීමට හෝ පියවර ගනු ඇත.

(ආ) පානීය ජල බෝතල්

පානීය ජලය ඇසුරුම් කිරීම සඳහා යොදා ගනු ලබන PET බෝතල් බෝතලවල ශ්‍රී ලංකා ප්‍රමිතිය අනිවාර්ය කරන ලෙස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ඉල්ලීමක් සිදුකොට තිබූ අතර, අධිකාරිය විසින් ඒ සඳහා අවශ්‍ය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබූ නමුත් SLS අනිවාර්ය කරමින් විධානයක් නිකුත් කිරීමට පෙර, මේනිසා නිෂ්පාදන වියදමට වන බලපෑම සලකා බැලිය යුතුව තිබුණි.

ඒ අනුව තවදුරටත් මේ සම්බන්ධව අදාල ආයතනයන් විශේෂයෙන් නිෂ්පාදකයන් හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමඟ සාකච්ඡා කරමින් කරුණු තවදුරටත් අධ්‍යයනය කරමින් සිටී.

මෙම තොරතුරු අනුව ප්‍රථම අදියර ලෙස PET බෝතල් සඳහා SLS මේ වනවිට අනිවාර්ය කරමින් ගැසට් නිවේදනයක් 2015.06.11 දින නිකුත් කරන ලදී.

මෙම ප්‍රමිතිය ක්‍රියාවට නැංවීමෙන් පසු ඒ අනුව නිෂ්පාදන පරිවැය වන ජලය හා ජලයෙහි ගුණත්වයද සලකා බලා ජල බෝතල් මිළක් නියම කිරීම පිළිබඳ සලකා බලනු ඇත.

4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

වීඩියෝ කැමරාව - මේ වන විට අදාල ආයතනයන්ගෙන් නිසි පුහුණුවක් ලබාදී ඇති අතර පුහුණුව ලත් එම නිලධාරීන්ට රාජකාරී භාවිතය සඳහා මෙම වීඩියෝ කැමරාව සහ අනෙකුත් කැමරා අදාල අංශය වෙත ලබාදී ඇති අතර මේ වන විට එය ක්‍රියාකාරී ලෙස යොදා ගනී.

4.4 ආර්ථික නොවූ ගනුදෙනු

(අ) මේ සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කිරීමෙන් මෙම දුරකථන සියල්ල ක්‍රියාකාරී තත්ත්වයට පත්කොට ඇත.

4.5 හඳුනා ගන්නා ලද පාඩු

2011.01.01 දින සිට 2014.04.28 දින දක්වා කාලය තුල මෙම තත්ත්වය තිබූ බව පරීක්ෂා කිරීමේදී දැනගැනීමට හැකිවූ අතර ඒ බව දැනගත් වහාම මේ ප්‍රමාණයද ඇතුළුව සම්පූර්ණ භූමි ප්‍රමාණයම පාරිභෝගික අධිකාරිය විසින් භාවිතයට ගන්නා අතර ඉදිරියේදී මෙසේ වැඩිපුර ගෙවා ඇති ප්‍රමාණය සතොස ආයතනයෙන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2012 වාර්ෂික වාර්තාව මේ වන විට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. 2013 කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර ඇත.

## 6. පද්ධති හා පාලන

(අ) වත්කම් මිලදී ගැනීම
(ආ) ඉන්වෙන්ට්‍රි පාලනය
(ඇ) ගිණුම්කරණ



හසිත තිලකරත්න
**සභාපති**